# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

# 2011 වාර්ෂික වාර්තාව

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

# පටුන

| | |
|---|---|
| දර්ශනය හා අපගේ මෙහෙවර | 3 |
| ආයතනික ව්‍යුහය | 4 |
| සභාපතිනියගේ සමාලෝචනය | 5 |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව | 7 |
| 2011 වසර තුළ ක්‍රියාකාරිත්වයේ විශේෂතා | 12 |
| මූල්‍ය සමාලෝචනය | 15 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 17 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 18 |
| මුදල්ප්‍රවාහ ප්‍රකාශය | 19 |
| ගිණුම් පිළිබඳ අදහස් | 20 |
| මානව සම්පත් සහ පොදු කාර්ය සංවර්ධනය | 22 |
| ජාතික වැඩසටහන් සඳහා සහභාගිවීම | 24 |
| නව බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම් | 24 |
| දේශීය හා විදේශීය පුහුණුවීම් | 26 |
| අංශයන්හි ප්‍රගතිය | 29 |
| විගණකාධිපති වාර්තාව | 38 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 46 |

## දර්ශනය

"සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා "

## මෙහෙවර

ආපදා අවදානම් අවමකරණය පෙරදැරිව සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය හා තාක්ෂණික දායකත්වය සැපයීම

## ආයතනික අරමුණු

- සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා ආපදා අවදානම් අවම කිරීමේ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම
- තිරසාර ආයතනයක් බවට පත් කිරීම
- විශිෂ්ට තාක්ෂණික සේවා මධ්‍යස්ථානයක් වීම
- නායයෑම් සහ භූ ආපදා වලදී නිරතුරුව සේවා සපයන ජාතික කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම
- තාක්ෂණික තොරතුරු සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම

# ජා.ගො.ප. සංවිධානයෙහි කළමනාකාරිත්වය

## විෂය භාර අමාත්‍ය

**ගරු මහින්ද අමරවීර**
ආපදා කළමනාකරණ අමාත්‍ය

**ගරු ඩුලිප් විජේසේකර**
ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍ය

## අන්තර්කාලීන කළමනාකරණ කමිටුව

**එස්.එම්. මොහොමඩ් මහත්මිය (සභාපතිනි)**

ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**ආචාර්ය ආසිරි කරුණාවර්ධන**

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**ජී.බී. සමරසිංහ මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**මේජර් ජනරාල් ගාමිණී හෙට්ටිආරච්චි මහතා (විශ්‍රාමික)**

අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**සංජීව විජේසිංහ මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

**කේ. ගුණවර්ධන මහත්මිය**

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

**ආචාර්ය ආසිරි කරුණාවර්ධන**

අධ්‍යක්ෂ ජනරාල්

**එම්.ඩී.සී. පෙරේරා මහතා**

අංශ ප්‍රධානි, පාරිසරික අංශය

**ආර්.එම්.එස්. බණ්ඩාර මහතා**

අංශ ප්‍රධානි, නායයෑම් අධ්‍යයන හා සේවා අංශය

**කිෂාන් සුගතපාල මහතා**

අංශ ප්‍රධානි, මානව ජනාවාස අංශය

**ජේ.කේ. ජයවර්ධන මිය**

අංශ ප්‍රධානි, ව්‍යාපෘති කළමනාකරණ අංශය

**එස්. මුතුරත්න මිය**

අංශ ප්‍රධානි, ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය

**කරුණා ද සිල්වා මිය**

අංශ ප්‍රධානි, භූ තාක්ෂණික හා ඉංජිනේරු අංශය

**එන්. විජේගුණවර්ධන මිය**

අංශ ප්‍රධානි, මානව සම්පත් කළමනාකරණ අංශය

**ආර්. තුඩුගල මිය**

අංශ ප්‍රධානි, මුදල් අංශය

**පරිපාලන සහ මූල්‍ය කටයුතු කැබිනට් අනුමැතිය ලැබූ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් පිහිටුවා ඇති අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි ක්‍රියාත්මක වේ.**

# සභාපතිනියගේ සමාලෝචනය



ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි අන්තර්කාලීන කළමනාකරණ කමිටු සභාපතිනිය වශයෙන්ද 2011 වසරෙහි දෙසැම්බර් මස 31 දිනට සම්පිණ්ඩනය කරන ලද මූල්‍ය වාර්තාව සමඟ වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව සතුටු වෙමි.

මෙම වාර්ෂික වාර්තාව මගින් ජා.ගො.ප. සංවිධානයෙහි තාක්ෂණික හා මූල්‍ය කාර්ය සාධනය බහු තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් වශයෙන් ජාතික සංවර්ධන ක්‍රියාවලියට ලබා දෙන දායකත්වයේ පැතිකඩක් පිළිබිඹු කරයි. ජා.ගො.ප. සංවිධානය 2011 වසර තුළ විවිධ සංවර්ධන කාර්යයන්හි නියුතු විය. එනම් නායයෑම් ආපදා ප්‍රදේශ හඳුනාගැනීම සහ එම ප්‍රදේශ සඳහා ආපදා කලාපීය සිතියම් සකස් කිරීම, ආපදා ප්‍රදේශවල අවදානම තක්සේරු කිරීම, ආපදා අවමකරණය සහ ඒ පිළිබඳ දැනුවත් කිරීම වැනි විශේෂ වැඩසටහන් නායයෑම් ආපදා අවම කිරීමේ ක්ෂේත්‍රය තුල ඉටුකර ඇති පොදු සේවාවන් වේ.

ජා.ගො.ප. සංවිධානයේ භූ තාක්ෂණික අංශය සතු පස් පර්යේෂණාගාරය දැනට වසර 25 කට පෙර ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණාගාරය තුල ලංකාවේ විශාල ව්‍යාපෘති රාශියක පස් පර්යේෂණ කර තිබේ. ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය මගින් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය පරීක්ෂා කර සුදුසු බව සඳහා සහතික නිකුත් කරනු ලැබේ. මෙම කාර්යයන් සඳහා සුපිරි පර්යේෂණාගාරයක් ආයතනය සතුව තිබේ. ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයේ ඇතිවිය හැකි ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය සේවා ලබාදීමද ආයතනය මගින් සිදුකෙරේ. දැනට පවතින ගොඩනැගිලි පරීක්ෂා කර ඒ පිළිබඳ තත්ත්ව වාර්තා නිකුත් කරනු ලැබේ. මානව ජනාවාස සැලසුම්කරණය හා සකසුරුවම් නිවාස සඳහා අවශ්‍ය සැලසුම් සහ කඳුකර ප්‍රදේශවල නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීමද සිදුකෙරේ. ජා.ගො.ප. ආයතනය මගින් සිදුකෙරෙන සේවාවන් අතර පරිසර විද්‍යාත්මක සේවා ලබාදීමද සිදු කෙරේ. එනම් පානීය ජලයේ ගුණාත්මක බව, අපවාහක ජලය මුදා හැරීම පිළිබඳ තත්ත්ව පරීක්ෂණ, පස් සහ වැලිවල රසායනික සංයුතිය පරීක්ෂා කිරීම ඒ අතර විශේෂ

ස්ථානයක් ගනී. මාගේ අමාත්‍යාංශයේ 2011 වසර තුළ ආපදා සම්බන්ධව කරන ලද කාර්යයන් සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම පිළිබඳව ජා.ගො.ප. සංවිධානයට ප්‍රශංසා කරමි.

පසුගිය වසර කිහිපය තුළ මුහුණ දුන් අසීරු තත්ත්වයෙන් මිදී 2011 වසර වඩාත් ඵලදායී වසරක් බවට පත් කර ගැනීමට හැකිවීම පිළිබඳ මා අතිශයින්ම සතුටට පත් වෙමි. මෙම වර්ෂයේ ආදායම රු. මිලියන 182 කි. එය පෙර වර්ෂය හා සසඳන කළ 43% ක ආදායම් ඉහළ යාමක් දක්නට ලැබේ. මෙම වර්ෂයේ උපදේශන සේවා මගින් සැළකිය යුතු ආදායමක් ලබා තිබේ. එනම් රු. මිලියන 108 ක් පමණ වන අතර එය පෙර වර්ෂයට වඩා 53% ක වර්ධන වේගයක් පෙන්නුම් කරයි.

ආපදා අවමකරණය සහ නායයිය ස්ථාන ස්ථාවර කිරීම සඳහා රජයෙන් ලැබෙන ප්‍රතිපාදන මෙම වර්ෂය තුළ ඉහළ යාමක් දක්නට ලැබේ. මෙය ආයතනයේ අනාගත සුබසිද්ධියට ඉමහත් රුකුලක් වේ. ජා.ගො.ප. සංවිධානය මගින් 2011 මාර්තු මස නායයෑම් ආපදා ප්‍රදේශවල සංවර්ධන කටයුතු සහ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රාදේශිය සභාවලින් ලබා දෙන අනුමැතියට පෙර යෝග්‍යතා සහතිකයක් නිකුත් කරනු ලැබේ. මෙය ආයතනයේ අතිරේක කාර්ය භාරයක් ලෙස සැලකියි හැකියි. මෙම අතිරේක කාර්යභාරය නිසා ආයතනයේ කාර්ය මණ්ඩලය ඉහළ යාමක්ද නිසාත්, උපකරණ සඳහා ප්‍රසම්පාදන වියදම් ඉහළ යාම නිසාත් ආයතනයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල ඉහළ යාමක් සිදුවී තිබේ.

අපගේ සේවා ඉටු කිරීමේදී ජා.ගො.ප. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ආසිරි කරුණාවර්ධන සහ කණ්ඩායම ලබා දුන් සේවාව ආයතනයේ දියුණුවට ඉමහත් රුකුලක් විය. මෙම කාර්ය මණ්ඩලය ලබා දුන් සේවාව ආයතනයේ ඉදිරි වර්ධනයට නව ජීවයක් ලබා දීමක් වේ.

මගේ හෘදයාංගම ස්තුතිය ආයතනයේ දියුණුව සඳහා ඇප කැපවීමෙන් සහ මග පෙන්වීමෙන් කටයුතු කළ අභ්‍යන්තර කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ට ප්‍රකාශ කරන අතර පාර්ශවකරුවන් ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාසය හා දිගින් දිගටම අප සමග කටයුතු කිරීම පිළිබඳව ස්තුති වන්ත වෙමි.

අපගේ එකමුතු බව රටේ සංවර්ධනයට ඉමහත් සහයෝගයක් ලබා දීමක් ලෙස මම විශ්වාස කරමි.

**සභාපතිනි**

අන්තර් කාලීන කළමනාකරණ කමිටුව

ජා.ගො.ප. සංවිධානය

(ලේකම්/ආපදා කළමනාකරණ

අමාත්‍යාංශය)

# අධ්‍යක්ෂ ජනරාල් වාර්තාව



ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් 2011 වසරෙහි දෙසැම්බර් මස 31 දිනට සම්පිණ්ඩනය කරන ලද වාර්ෂික වාර්තාව හා මූල්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳව සතුටු වෙමි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වසර 27 කට පෙර සිට නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍යතාවය තේරුම්ගෙන ස්ථාපිත කරන ලදී. ජා.ගො.ප. සංවිධානය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතට පත්වීමත් සමගම එහි සේවා ආපදා අවදානම් අවම කිරීම යන ආයතනික අභිමතාර්ථයට අනුරූප වන අයුරු සකස් කරන ලදී. වර්තමානයේ ආපදා කළමනාකරණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නිරත වී සිටී. විශේෂයෙන්ම ආපදා කළමනාකරණයට ඔරොත්තු දෙන රටක් ගොඩ නැංවීමට ආයතනික සේවා තුළින් බලාපොරොත්තු වේ. ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය ලෙස ජා.ගො.ප. සංවිධානය අද වන විට මනා කළමනාකාරිත්වයකින් යුත් පිළිගත් ආයතනයක් බවට පත්වී තිබේ. අද වන විට මෙම විශ්වාසය තහවුරු කෙරෙන පරිදි තාක්ෂණික සේවා ලබා දීමට ආයතනය සමත් වී තිබේ.

ජාතික සංවර්ධනයේදී සහ දිළිඳුකම පිටුදැකීම මගින් ජීවිත සාරවත් කිරීම සඳහා ආපදා අවදානම අඩු කිරීම මගින් රජයට සහයවීම අපගේ එක් අරමුණක් විය. නායයෑම් අවමකරණය, ක්‍රමවත්ව ඉඩම් පරිහරණය, ශක්තිමත් ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම හා සහතික කිරීම, ජලය වාතය ශබ්දය පිළිබඳව පරිසර අනුකූලතාවය පාංශු ස්ථායිතාවය පරීක්ෂා කිරීම ආදිය මගින් ආපදා අවම කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි අරමුණ වේ.

## ප්‍රවීණතා

ජා.ගො.ප. සංවිධානයේ පිළිගත් පර්යේෂණ සහ තාක්ෂණික සේවා සපයන ආයතනයක් ලෙස ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයෙහි විවිධ සේවාවන් රැසක් ඉටුකර තිබේ. නායයෑම් අවමකරණය, ක්‍රමවත් ඉඩම් පරිහරණය, ශක්තිමත් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම හා සහතික කිරීම, ජලය, වාතය, ශබ්දය පිළිබඳව පරිසර අනුකූලතාවය, පාංශු ස්ථායීතාව පරීක්ෂා කිරීම ආදිය මගින් ආපදා අවම කිරීම ජා.ගො.ප. සංවිධානයේ අරමුණ වේ. දැනට නායයෑම් සහ ඒ ආශ්‍රිත භූ උවදුරු පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ. ජා.ගො.ප. සංවිධානයේ කාර්යයන් ලෙස නායයෑම් ආපදාවට ලක්වූ ප්‍රදේශ හඳුනා ගැනීම, එම ප්‍රදේශ සිතියම් ගත කිරීම, ඉදිරියේදී ඇතිවිය හැකි නායයෑම් අවදානම අවම කිරීම සඳහා නායයෑම් අවදානම් ප්‍රදේශ ලෙස හඳුනාගත් දිස්ත්‍රික්කයන්හි සංවර්ධන/ ඉදිකිරීම් සිදුකිරීමට ප්‍රථම පළාත් පාලන ආයතන මගින් ජා.ගො.ප. සංවිධානයේ පෙර අනුමැතිය ලබාගත යුතු වේ.

## ආදායම්

ආපදා අවදානම් අවම කිරීම ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා රජය මගින් ඒ සඳහා ප්‍රතිපාදන සපයා තිබේ. ඊට අමතරව රාජ්‍ය ප්‍රතිපාදන වාර්ෂිකව රසායනාගාර උපකරණ සහ ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස ලබා දෙනු ලැබේ. සමහර අවස්ථාවල විදේශීය ආධාර සහ ප්‍රතිපාදන පර්යේෂණ සහ ව්‍යාපෘති සඳහා ලබා දෙනු ලැබේ.

කෙසේ නමුත් ආයතනය රජයේ සහ පෞද්ගලික උපදේශක සේවා සහ රසායනාගාර පර්යේෂණ මගින් උපයන ආදායම් මගින් පුනරාවර්තන සහ අනිකුත් වියදම් උපයා ගනී. 2007 සිට 2011 දක්වා දිගින් දිගටම ශුද්ධ ආදායම් ලැබූ අතර මෙම වර්ෂයේ වාර්තාගත ආදායම් ඉහළ යාමක් පෙන්නුම්කර තිබේ. එය රුපියල් මිලියන 182 කි. එහි වර්ධන වේගය පෙර වර්ෂයට වඩා 43% ක් වේ. රසායනාගාර පරීක්ෂණ සහ තාක්ෂණික සේවා මගින් ඉපැයූ ආදායම රුපියල් මිලියන 108 ක් පමණ වේ. නායයෑම් ආපදා අවමකරණය සඳහා රජයේ ප්‍රතිපාදන ලබා දීම රුපියල් මිලියන 73 දක්වා ඉහළ ගොස් තිබේ.

## ජාතික සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම්

ජාතික සංවර්ධනය සඳහා ආපදා අවදානම් අවම කිරීම තුලින් ජනතාවගේ දිළිඳු බව අඩුකර ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා සහාය වීම අපගේ ඉලක්කය වේ. මේ සඳහා ආපදා අවමකරණයේදී විවිධ කාර්යයන් තුල නිරත විය. එනම් විධිමත් ඉඩම් පරිහරණය, ශ්‍රී ලංකා ප්‍රමිතිකරණයට අනුව ගොඩනැගිලි අමුද්‍රව්‍ය රසායනාගාර පර්යේෂණ කර සහතික නිකුත් කිරීම, පස් පර්යේෂණ, වායු, ශබ්ද හා ජලය පිළිබඳ පරිසර විද්‍යාත්මක ගවේෂණ කිරීම යනාදිය වේ. නායයෑම් ආපදා අවදානම් අවම කිරීමේ කාර්යයන්හි ජා.ගො.ප. සංවිධානය ඉතා තීව්‍ර ලෙස නිරත වීම නිසා නායයෑම් ආපදාවලට ලක්වීම පසුගිය දශකය තුල අඩුවීමක් පෙන්නුම් කරයි. ජා.ගො.ප. සංවිධානය නායයෑම් ආපදා අවදානම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති කාර්යයන් අතර නායයෑම් ආපදා ප්‍රදේශ සිතියම් ගත කිරීම, ආපදා අවමකරණය, ප්‍රජාව ඒ පිළිබඳ දැනුවත් කිරීම සහ පුහුණු කිරීම, නායයෑම් ආපදා ප්‍රදේශවල කරනු ලබන ඕනෑම ඉදිකිරීමකදී හෝ සංවර්ධන කටයුත්තකදී ප්‍රාදේශීය සභා ගොඩනැගිලි ඉදිකිරීම් අනුමැතියට පෙර අනුමැතිය ලබා ගැනීම. මේ මගින් කඳුකර ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා වඩාත් යෝග්‍ය ආපදා අවම කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට හැකිවීම තුලින් ආපදා අවස්ථාවලදී ආපදාවලින් බේරා ගැනීම සඳහා කරනු ලබන යෙදවුම්වල අඩුවීමක් දක්නට ලැබේ. ආයතනයේ අනිකුත් ක්ෂේත්‍රයන් සඳහා ලබා දෙන තාක්ෂණික සේවා මගින්ද රටේ සැලසුම් සහ සංවර්ධනය සඳහා උපරිම සහයෝගයක් ලබා දීම තුළින් ජාතික අයවැය සඳහා සැළකිය යුතු ඉතිරියක් සඳහා සහයෝගය ලබා දීමත් සිදුකර තිබේ.

## ආයතනික වැඩි දියුණු වීම

තොරතුරු සහ සන්නිවේදන ඒජන්සිය සමග ඒකාබද්ධව ආයතනය සඳහා නව වෙබ් අඩවියක් ක්‍රියාත්මක කිරීම. රජයේ ආධාර මගින් ආයතනයට අවශ්‍ය උපකරණ ලබා ගැනීමෙන් ධාරිතාව වැඩිකර ගෙන තිබේ.

මහා භාණ්ඩාගාරයේ රු. මිලියන 11 ක මුදලක් ප්‍රසම්පාදන සඳහා නායයෑම් ආපදා හඳුනා ගැනීම සඳහා උපකරණයක් මිලදී ගෙන තිබේ. භූ තාක්ෂණික අංශයේ රසායනාගාරය සඳහා අවශ්‍ය විශේෂ රසායනාගාර උපකරණ ලබා ගැනීම, රු. මිලියන 5 ක වියදමින් නායයෑම් ආපදා ප්‍රදේශවල විශේෂ භූ විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය අර්ධ ස්වයං ක්‍රියාකාරී යන්ත්‍රයක් ලබා ගෙන තිබේ. මෙම යන්ත්‍රය ලංකාවේ වෙනත්

රසායනාගාර තුළ දැකිය හැක්කේ ඉතා කලාතුරකිනි. විද්‍යාඥයින්ගේ කාර්යක්ෂමතා වැඩිකිරීම සඳහා සෑම විද්‍යාඥයකුටම පරිගණකය බැගින් ලබා දීමට හැකිවී තිබේ. ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය සහ පරිපාලන අංශය ස්ථාන ගත කර ඇති ගොඩනැගිලි ඉඩ ප්‍රමාණය වැඩිකිරීම සඳහා අභ්‍යන්තර කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබේ. නව බඳවා ගැනීමේ පරිපාටිය සහ උසස්වීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2011 වර්ෂය මැද භාගය වන විට ලබා ගත හැකි විය. කාර්ය මණ්ඩල වර්ධනය සඳහා ක්‍රමවත් වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේ. විද්‍යාඥයින්ගේ දැනුම සහ පළපුරුද්ද වැඩි දියුණු කර ගැනීම සඳහා දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අවස්ථාව ලබා දී තිබේ.

පසුගිය කාලයේ අක්‍රියව පැවති පර්යේෂණ කමිටුව නැවත ක්‍රියාත්මක කිරීම තුලින් පර්යේෂණ කටයුතු සඳහා ආයතනය තුළ නව ජීවයක් ලබා දීමට හැකිවේ. ආයතනයේ පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පරිදි බාහිර හා අභ්‍යන්තර විද්‍යාඥයින් මෙම කමිටුව සඳහා තෝරාගෙන තිබේ. මෙම කමිටුවේ මූලික අභිප්‍රාය ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කේන්ද්‍රගත කිරීම සහ ඒකාබද්ධ කිරීම සහ ආයතනයට අනුරූප පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා ජාතික සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ ව්‍යාපෘති සඳහා සහයෝගය ලබා දීම.

## පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ වීම

පෞද්ගලික අංශයේ අධීක්ෂණ කටයුතු සඳහා උපදෙස් දීම සහ එම ආයතනය සමග එකතුවී සංකීර්ණ ව්‍යාපෘති සඳහා සහයෝගය ලබා දීම මගින් එම ව්‍යාපෘති කඩිනම් කිරීම. පෞද්ගලික අංශය සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි හු තාක්ෂණික කටයුතු, පරිසර විද්‍යාත්මක පර්යේෂණ සහ තක්සේරු කිරීම්, නායයෑම් ආපදා අවදානම් අවම කිරීමේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සඳහා සේවා ලබා දීම.

## අවහිරතා/ දුෂ්කරතා

ආයතනයේ දියුණුව සඳහා බාධක රාශියක් පවතී. ඒවා පහත සඳහන් අයුරු දැක්විය හැකිය.

- රාජ්‍ය අංශයේ වෙනත් ආයතනවලට මෙන් ජා.ගො.ප. සංවිධානය සඳහා නීතිමය පසුබිමක් නොමැතිවීම. කැබිනට් තීරණයකට අනුව ආයතනය ස්ථාපිත වී ඇති නමුත් ඒ සඳහා පාර්ලිමේන්තු පනතක් මගින් වෙනම ආයතනයක් ලෙස ස්ථාපිත වී නොමැත. ආයතනය සඳහා නීතිමය පසුබිමක් නොමැති වීම එහි වර්ධනයට ඇති මූලික බාධකයක් වේ. ඒ සඳහා ගනු ලැබූ උත්සාහය තවමත් සාර්ථක වී නොමැත. එසේ නමුත් 2009 වර්ෂයේ පනතක් කෙටුම්පත් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබේ. ආයතනය ස්ථාපිත කිරීම සඳහා ඉතාමත් ප්‍රවේශමෙන් සහ සුපරීක්ෂාකාරීව පනතක් කෙටුම්පත් කර තිබේ. එම පනත පාර්ශවකරුවන් සඳහා ඉදිරිපත් කර ඒ සඳහා අදහස් ලබාගෙන නැවත සකස් කර තිබේ. මෙම බාධකවලින් ගොඩ ඒම සඳහා ආයතනික ක්‍රියාවලිය කඩිනම් කළ යුතු වේ.
- ආයතනය සඳහා පනතක් නොමැති වීම නිසා එය නීත්‍යානුකූල ආයතනයක් ලෙස පිළිනොගැනීම නිසා රසායනාගාර සඳහා ප්‍රමිතිකරණය ලබා ගැනීමට නොහැකි වී තිබේ.
- ජා.ගො.ප. සංවිධානය සඳහා කාර්ය මණ්ඩල ලේඛනය සම්මත වී තිබුනත් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වූයේ මෙම වසර මැද භාගයේදීය. මේ නිසා ආයතනයේ වැඩ කටයුතු සඳහා සුදුසු පුද්ගලයන් බඳවා ගැනීම ප්‍රමාද වී තිබේ. එපමණක් නොව දැනට පවතින සේවක

පිරිස රඳවා ගැනීමද අපහසු වී තිබේ. ඊට හේතුව වෙනත් ආයතනවල ඉහළ වැටුප් ලබාදීම සහ ප්‍රතිලාභ ලබා දීම නිසා ඒ ආයතනය කරා ඇදී යාමයි. ස්වයං ආදායම් මත යැපෙන ආයතනයක් වුවත් ඒ සඳහා විශේෂ දීමනාවක් නොමැති නිසා මෙම තත්ත්වය තවත් උග්‍ර අතට හැරී තිබේ.

## දුර්වලතා සහ දුෂ්කරතාවලින් මිදීම

- ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් ලෙස ජා.ගො.ප. සංවිධානය ජාතික අවශ්‍යතාවය සඳහා සේවා ලබාදීමට නීත්‍යානුකූල බලය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.
- යටිතල පහසුකම් සහ පුහුණු කිරීම් සඳහා ඇති හිඩැස පර්යේෂණ සඳහා සුදුසු සැලැස්මක් සකස් කිරීම තුළින් කළමනාකරණ පද්ධතිය වඩාත් ගුණාත්මක වෘත්තීය සේවාවන් ලබා දීමට හැකි අයුරින් සකස් කිරීම
- ආයතනය පර්යේෂණ සංවර්ධන සහ උපදේශන සේවා වැඩි කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සහ ව්‍යාපෘති මගින් ආයෝජන ලබා ගැනීම
- ජාතික විද්‍යා පදනම සහ ජාතික පර්යේෂණ සභාව මගින් පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සහ ප්‍රතිපාදන ලබා ගැනීමට විද්‍යාඥයින් උනන්දු කිරීම
- ගුණාත්මක පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කිරීම සඳහා අවශ්‍ය විධිමත් ක්‍රියා පද්ධතියක් ස්ථාපිත කිරීම
- විද්‍යාඥයින් පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා පූර්ණකාලීනව නිදහස් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම
- දැනට පවතින පුහුණු කිරීමේ වැඩසටහන් අනාගත අභිවෘද්ධියට සුදුසු අයුරු පුළුල් කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම
- තරගකාරීත්වය තුළින් වෘත්තීමය දක්ෂතා ඔප් නැංවීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

## අනාගත සැළසුම්

එන වසර සඳහා ආයතනික සංයුක්ත සැලැස්මට අනුව රජයේ ප්‍රතිපාදන රු.මිලියන 146 ක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. එය මුලු ආදායමින් එනම් රු. මිලියන 245 න් 60% ක ප්‍රමාණයක් වේ. මෙය විශාල වශයෙන් වෙනස් වීමක් සිදුවිය හැකියි. ඊට හේතුව ගැරඩිඇල්ල නායයෑම් ආපදා අවමකරණ ව්‍යාපෘතියට ප්‍රමුඛතාවය ලබා දිම තුළින් සහ එය කඩිනම් කිරීම තුලින් මෙම ප්‍රමාණය විශාල ලෙස වෙනස් විය හැකියි. මීට අමතරව නායයෑම් ආපදා අවම කිරීම සඳහා ව්‍යාපෘති 47 ක් හඳුනාගෙන තිබේ. මේවා එදිනෙදා කරගෙන යන වැඩවලට අමතර කාර්යයන් නිසා එය ආයතනයට අතිරික්ත ක්‍රියාවලියක් වනු නොඅනුමානය. ආපදා තක්සේරුකරණය අනුව මෙම ප්‍රදේශ සඳහා ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කර තිබේ. මෙම වැඩසටහනේ පළමු අදියර ලෙස දිස්ත්‍රික්ක 4 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් අනිකුත් දිස්ත්‍රික්ක සඳහා දෙවන සහ තුන්වන අදියර යටතේ ක්‍රියාත්මක කිරීමටත් බලාපොරොත්තු වේ.

මෙම කඩිනම් විශාල ව්‍යාපෘති සංඛ්‍යාව කරගෙන යාම සඳහා ආයතනයට ශක්තිමත් ව්‍යාපෘති කළමනාකරණ අංශයක් අවශ්‍ය වේ.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2010 සිට 2030 දක්වා ව්‍යාපෘති යෝජනාවලියක් සකස් කර තිබේ. මෙහිදී අනාගතයේ විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක ක්‍රියාකාරී ආයතනයක් ලෙස ජා.ගො.ප. සංවිධානයේ ක්‍රියාකාරිත්වය හඳුනාගෙන තිබේ. ස්වාභාවික ආපදා ප්‍රදේශවලින් මානව

ජනාවාස ඉවත් කර එම ප්‍රදේශ සංවේදී කලාප ලෙස සලකා නැවත වන රෝපනය කිරීම තුලින් ආපදා අවමකරණය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

මේ සඳහා ජා.ගො.ප. සංවිධානය පාර්ශවකරුවන් සමග එකතු වී ඉතාමත් යෝග්‍ය සංවර්ධන යෝජනාවලියක් සකස් කළ යුතුවේ. දැනටම අප ආයතනය මෙම ප්‍රදේශවල ඉඩම් සංවර්ධනය කිරීමේදී සහ ඉදිකිරීම් ක්‍රියාවලියේදී අනුමැතිය ලබා ගත යුතු වේ. දැනටම ජා.ගො.ප. සංවිධානය එහි කාර්යභාරය ලෙස අස්ථාවර ප්‍රදේශ හඳුනා ගැනීම සහ එම ප්‍රදේශවල ආපදා අවමකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් එය තහවුරු කර තිබේ. මේ සඳහා රජයෙන් සහ අනිකුත් ආයතනවලින් ප්‍රතිපාදන බලාපොරොත්තු වේ.

ජාතික අවශ්‍යතා සඳහා උදව් කිරීමක් ලෙස වෙරළාශ්‍රිත ප්‍රදේශවලින් කි.මී. 3 ක් පමණ දුරින් ආපදාවලට ඔරොත්තු දෙන ප්‍රදේශවල නගර සංවර්ධන කටයුතු කළ යුතු වේ.


ජාතික විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණික කමිටුව, ජාතික පර්යේෂණ හා සංවර්ධන ආයතනය සමග එකතු වී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබේ. මෙම සැලැස්ම තුළින් ජා.ගො.ප. සංවිධානය සඳහා සංවර්ධන ව්‍යාපෘති රාශියක් හඳුනාගෙන තිබේ. මෙම ව්‍යාපෘති සඳහා ඉදිකිරීම්, ගොඩනැගිලි අමුද්‍රව්‍ය පර්යේෂණ, භූ තාක්ෂණික විමර්ශන කටයුතු, මානව ජනාවාස සැලසුම්, ආපදා අවදානම් අවමකරණය හා පාරිසරික විද්‍යාත්මක පර්යේෂණ කටයුතු කරනු ලැබේ. මෙම පර්යේෂණ සඳහා විශේෂිත ආයතනයක් ලෙස හඳුනාගෙන තිබුනත් තවමත් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත.

ජා.ගො.ප.සංවිධානයේ එහි ප්‍රාදේශීය සංවර්ධිත ධාරිතාව වැඩිකිරීම සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලයේ සිට සේවා විමධ්‍යගත කිරීම සඳහා අදාළ දිස්ත්‍රික්කවල ප්‍රාදේශිය කාර්යාල තුළ රසායනාගාර ස්ථාපිත කිරීම ප්‍රමුඛතාවය ලෙස සළකා කටයුතු කරගෙන යනු ලැබේ.

## ඇගයීම්

ජා.ගො.ප. සංවිධානයේ සාර්ථකත්වය උදෙසා නියමු මග පෙන්වීම සහ උපදෙස් ලබා දීම පිළිබඳව ආපදා කළමනාකරණ ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා, ආපදා කළමනාකරණ ගරු නියෝජ්‍ය අමාත්‍ය දුලිප් විජේසේකර සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය සහ අභ්‍යන්තර කළමනාකරණ කමිටුවේ සභාපතිනිය එස්.එම්. මොහමඩ් මහත්මියට ආයතනයේ සාර්ථකත්වය උදෙසා නායකත්වය ගෙන කටයුතු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙමි. අභ්‍යන්තර කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් - මහා භාණ්ඩාගාරයේ අය වැය දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ ජනරාල් - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ විධායක නිලධාරි ආසියානු ආපදා පෙර සූදානම් වීමේ මධ්‍යස්ථානය දැක්වූ සහයෝගය සඳහා ස්තුතිවන්ත වෙමි. මීට අමතරව අපගේ පාර්ශවකරුවන් අප කෙරෙහි තැබූ විශ්වාසයට මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කරමි.


මේ සැම දෙයින්ම පරිපූර්ණ වුවත් මාගේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම නොමැතිව අපගේ අභිමතාර්ථ කරා ළඟාවිය නොහැකි බව මාගේ හැඟීම යි.



ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

# 2011 වසර තුළ ක්‍රියාකාරිත්වයේ විශේෂතා







ජා.ගො.ප. සංවිධානය තාක්‍ෂණික දායකත්වය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙමින් නායයෑම් හා අනෙකුත් භූ ආපදා අවමකරණය, මානව ජනාවාස සැළසුම්කරණයත්, භූ තාක්ෂණික ඉංජිනේරු සේවා සැපයීමත්, ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ තාක්‍ෂණ සේවා ලබා දීමත්, පාරිසරික කළමනාකරණය හා ඉංජිනේරුමය ව්‍යාපෘති කළමනාකරණය ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ජාතික වශයෙන් සිය සේවා සපයනු ලැබීය.


පසුගිය වර්ෂ කිහිපය තුළ ජා.ගො.ප. සංවිධානය පර්යේෂණ අංශයෙන් තම දක්‍ෂතා විවිධ ආකාරයන්ගෙන් වැඩි දියුණු කර ගනිමින් මේ වන විට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට පර්යේෂණ කටයුතුවලින් දායකවන ආයතනයක් ලෙස තම වගකීම මැනවින් ඉටුකරණ ලදී. අපගේ එක් ඉලක්කයක් වූයේ ආපදා අවදානම අවම කර ගැනීම තුලින් ජනතාවට ගුණාත්මක බැවින් ඉහළ ජීවන තත්ත්වයක් ලබා දීමෙන් ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක වීමයි.



ආයතනයේ සංයුක්ත සැලැස්මට හා එහි අභිමතාර්ථයන්ට අනුකූලව පහත සඳහන් කාර්යයන්හි නිරත විය.



- පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ තාක්‍ෂණික දායකත්වය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දීම. එනම් නායයෑම් හා අනෙකුත් භූ ආපදා අවමකරණය, මානව ජනාවාස සැළසුම්කරණයත්, භූ තාක්ෂණික ඉංජිනේරු සේවා සැපයීමත්, ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ තාක්‍ෂණ සේවා ලබා දීමත්, පාරිසරික කළමනාකරණය හා ඉංජිනේරුමය ව්‍යාපෘති කළමනාකරණ ආදී සේවා සැපයීම.
- නායයෑම් ආපදා කලාප සිතියම්කරණය 1:10,000 සහ 1:50,000 පරිමාණයට දිගින් දිගටම සිදු කෙරේ. මෙම සිතියම් ජාතික සැලසුම්කරණය හා ප්‍රාදේශීය සැලසුම්කරණය සඳහා සහ නායයෑම් පිළිබඳ පූර්ව දැනුම් දීම සිදුකිරීමට මෙන්ම ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීමට උපයෝගීකර ගනී.




- අයහපත් කාලගුණික තත්ත්වයන් උදාවන අවස්ථාවන්හිදී නායයෑම් පිළිබඳ පූර්ව දැනුම් දීමේ වගකීම ආයතනය සතු වේ.



- ඉදිරියේදී ඇතිවිය හැකි නායයෑම් අවදානම් අවම කිරීම සඳහා 2011 වර්ෂයේ මාර්තු මාසයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුව නායයෑම් ආපදා අවදානම් හඳුනාගත් දිස්ත්‍රික්ක තුළ සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතුවලදී ප්‍රාදේශීය සභා අනුමැතිය ලබා දීමට පෙර ජා.ගො.ප. ආයතනයේ යෝග්‍යතා සහතිකය ලබා ගත යුතුවේ.



- ජා.ගො.ප. සංවිධානය මෑතක සිට නායයෑම් ආපදා ප්‍රදේශවල නාගරික සහ අර්ධ නාගරික කලාපවල නැවත පදිංචි කිරීම ආර්ථිකමය වශයෙන් දායක පියවරක් නොවන නිසා ආපදා අවමකරණ ව්‍යාපෘති ආරම්භ කරන ලදී. දැනට පේරාදෙණිය, පදියපැලැල්ල, ගැරඩිඇල්ල නායයෑම් ආපදා අවමකරණ ව්‍යාපෘතිය ආරම්භ කර








තිබේ. ඉදිරි වසර 5 තුළදී මධ්‍යම පළාතේ සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මෙවැනි ව්‍යාපෘති 16 ක් ආරම්භ කිරීමට සැළසුම්කර තිබේ.

- නායයෑම් ආපදාවක් සිදුවූ අවස්ථාවකදී එම ප්‍රදේශය තුළ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මානව ජනාවාස ආශ්‍රිතව සිදුවී ඇති දේපොළ සහ ජීවිත හානි පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන්ට නිර්දේශ ලබා දෙනු ලැබී ය.
- නායයෑම් ආපදාවක් සිදුවූ අවස්ථාවක ජාතික අවශ්‍යතාවයක් ලෙස සළකා එම සංසිද්ධිය නිසා ආපදාවට පත්වූ පවුල් සඳහා සුදුසු ඉඩම් ලබා දීමේ විමර්ශන කටයුතුවල නිරත විය.
- ජා.ගො.ප. සංවිධානයේ භූ විමර්ශන කටයුතු රසායනාගාර පර්යේෂණ සේවා ලබා දීම පිළිබඳව කීර්තිමත් නාමයක් ලබා තිබේ. මෙහිදී මූලික කාර්යයන් ලෙස ස්ථානයේ පස් පර්යේෂණ, ඉදිකිරීම් සඳහා යෝග්‍ය තාක්ෂණික සේවා, පස් ස්ථායීකරණය පිළිබඳ උපදෙස් ලබා දෙනු ලැබී ය.
- ජලය, අපවාහක ජලය, ශබ්ද දූෂණය පිළිබඳ තත්ත්ව පරීක්ෂණ සහ විවිධ ව්‍යාපෘති සඳහා පාරිසරික විද්‍යාත්මක අධ්‍යයන කටයුතුවල නිරත විය.
- ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම ආයතනයේ තවත් විශේෂ සේවාවක් වේ. මේ යටතේ ගොඩනැගිලිවල තත්ත්ව පරීක්ෂාව හා වාර්තා සැපයීම පවතින ගොඩනැගිලිවල ශක්තිමත් භාවය සහ ව්‍යුහාත්මක ස්ථාවරතාවය පිළිබඳ නිර්දේශ ලබා දීම සිදු කෙරිණ.

# මූල්‍ය සමාලෝචනය

## ආදායම්

මෙම වර්ෂය සඳහා වාර්තාගත ආදායමක් ලබා තිබේ. එනම් රු.මිලියන 182 කි. එය ගිය වර්ෂය හා සසදා බලන කල 43% ක වර්ධන වේගයක් පෙන්නුම් කරයි.

උපදේශන සේවා මගින් ලැබූ ආදායමද පෙර වර්ෂයට වඩා ඉහළ ගොස් තිබේ. එනම් රු. මිලියන 108 කි. නායයෑම් සහ අනිකුත් පර්යේෂණ සඳහා ලැබූ රජයේ ප්‍රතිපාදන රු. මිලියන 73 ක් වේ.

ආපදා අවමකරණය සඳහා ලැබූ ආයතනයේ ආදායම ඉහළ යාමක් මෙන්ම අනාගතයේ විශේෂ කාර්ය භාරයක් ඉටුකිරීමට අවස්ථාවක් සලසා දීමක් ලෙස සැලකිය හැකියි.


මෙය ජා.ගො.ප සංවිධානයට අතිරේක වැඩ ප්‍රමාණයක් එකතු වීමකි. මෙය ආයතනයට විශාල ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ධාරිතාව වැඩිකර ගැනීමට අවස්ථාව උදාකර ගැනීමකි. මේ නිසා සේවක සංඛ්‍යාව බඳවා ගැනීම ඉහළ යාමක් මෙන්ම අවශ්‍ය උපකරණ ගැනීම සඳහා ප්‍රසම්පාදන වියදම් සහ මූල්‍ය ආදායම් ඉහළ යාමක් සිදු කෙරේ. ජා.ගො.ප. සංවිධානය එන වසර සඳහා පිළියෙල කර ඇති සාමූහික සැලස්මට අනුව රජයේ ප්‍රතිපාදන මිලියන 146 ක් බලාපොරොත්තු වේ. එය එන වසර සඳහා බලාපොරොත්තු වන ආදායමින් 60% කි. එනම් මුළු ආදායම රු. මිලියන 245 ක් වේ.

ජා.ගො.ප. සංවිධානයට නායයෑම් ආපදාවලට ලක්වන දිස්ත්‍රික්ක 10 තුළ නායයෑම් ආපදා අවම කිරීම සඳහා ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතුවලදී ජා.ගො.ප. සංවිධානයට යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීමේ බලය පවරා තිබේ. මේ සඳහා දිස්ත්‍රික්ක 10 තුළ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර තිබේ. මේ සඳහා මාසික වියදම රු. මිලියන 3 ක් පමණ වේ. මේ සඳහා රු. මිලියන 30 ක් රජයේ ප්‍රතිපාදන වලින් බලාපොරොත්තු විය. මුළු වියදම වන රු. මිලයන 30 න් රු. මිලියන 10.6 ක් එම ප්‍රදේශවල ප්‍රාදේශීය සභා මගින් සහ පුද්ගලයින් සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීමෙන් උපයාගෙන තිබේ.


මෙම වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයට අනුව ආයතනයේ මුළු වියදම රු.මිලියන 189.25 වී තිබේ. මෙය පේරාදෙණිය සහ පදියපැලැල්ල නායයෑම් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා රජය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන වන රු. මිලියන 52 ද ඇතුළුව වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා 2011 දෙසැම්බර් 31 දින වන විට රජයේ ප්‍රතිපාදන ලබාදී තිබුනේ රු. මිලියන 16 ක් පමණි. ඉතිරි මුදල ආයතනය තුලින් උපයා ගන්නා ලදී.

මීට අමතරව පර්යේෂණ සඳහා රජයේ ප්‍රතිපාදන රු. මිලියන 21.5 ක් සහ රසායනාගාර සහ ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 21.5 ක් බලාපොරොත්තු විය. මින් පර්යේෂණ සඳහා රු. මිලියන 17. 5 ක් සහ ප්‍රසම්පාදන වියදම් සඳහා රු. මිලියන 15 ක් රජයේ ප්‍රතිපාදන වලින් ලබා දී තිබුණි. මීට අමතරව රු. මිලියන 10 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා රජයේ ප්‍රතිපාදන ලෙස නායයෑම් ආපදා විශේෂ විමර්ශන කටයුතු සඳහා ලබාදීමට එකග වී තිබුණි. නමුත් එම මුදලින් රු. මිලියන 6.5 ක් ලබා දී ඇති අතර රු. මිලියන 3.5 ක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.


උපදේශන සහ පරීක්ෂණ සේවා ආදායම්





නායයෑම් අවමකරණ අයවැය




පර්යේෂණ සහ ප්‍රසම්පාදන ප්‍රතිපාදන




මුළු ආදායම




මෙම වර්ෂය සඳහා ආයතනයේ මුළු මෙහෙයුම් ආදායම රු. මිලියන 181.8 ක් වූ අතර මෙහෙයුම් වියදම රු. මිලියන 162.5 ක් වී තිබේ. මෙම වියදම් පෙර වර්ෂයට වඩා එනම් 203 ක් වූ කාර්ය මණ්ඩලය 236 දක්වා වැඩිකිරීම නිසා දෛනික ගෙවීම් සඳහා බඳවාගත් සේවකයින් සඳහා 2010 වර්ෂයේදී රු. මිලියන 75.2 ක් ගෙවා තිබූ අතර එය 2011 වර්ෂයේදී රු. මිලියන 94.4 දක්වා ඉහළ ගොස් තිබුණි.

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| *2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | 2011<br>රු. | 2011<br>රු. | 2010<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 79,924,846.06 | | 82,361,235.65 | |
| අනියම් ණය ( 1991 to 2008) | 5,266,577.03 | | 6,065,479.97 | |
| | | 85,191,423.09 | | 88,426,715.62 |
| ජංගම වත්කම් | | | | |
| පරිලේඛණ | 705,366.59 | | 295,206.44 | |
| නැවත අයවන ගෙවීම් | 289,898.42 | | 244,898.42 | |
| නොනිම් වැඩ | 1,561,109.39 | | 5,519,008.04 | |
| විවිධ ණය (2009 to 2011) | 16,281,604.84 | | 20,402,336.50 | |
| විවිධ අයවිය යුතු/ ප්‍රතිපාදන සහ ව්‍යාපෘති | 49,911,229.02 | | 200,000.00 | |
| තැන්පතු | 4,416,731.57 | | 3,220,579.30 | |
| අත්තිකාරම් | 4,476,121.33 | | 10,596,474.04 | |
| පෙර ගෙවීම් | 335,158.95 | | 135,390.00 | |
| මුදල් සහ ද්‍රවශීල වත්කම් | 9,835,650.71 | | 42,593,764.59 | |
| | | 87,812,870.82 | | 83,207,657.33 |
| සම්පූර්ණ වත්කම් | | **173,004,293.91** | | **171,634,372.95** |
| **බැරකම්** | | | | |
| ජංගම බැරකම් | | | | |
| විවිධ ණයහිමියන් | 2,084,027.59 | | 18,053,645.35 | |
| උපචිත වියදම් | 6,701,041.95 | | 4,418,769.30 | |
| අයවන තැන්පතු | 2,262,276.95 | | 872,370.00 | |
| | | 11,047,346.49 | | 23,344,784.65 |
| ජංගම නොවන බැරකම් | | | | |
| සුබ සාධක අරමුදල | 374,261.10 | | 374,261.10 | |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 32,147,490.50 | | 29,030,157.50 | |
| | | 32,521,751.60 | | 29,404,418.60 |
| සම්පූර්ණ බැරකම් | | **43,569,098.09** | | **52,749,203.25** |
| සම්පූර්ණ ශුද්ධ වත්කම් | | **129,435,195.82** | | **118,885,169.70** |
| **ශුද්ධ වත්කම්** | | | | |
| අයවීම් | 2,264,497.95 | | 2,264,497.95 | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 27,875,989.31 | | 27,875,989.31 | |
| රාජ්‍ය ප්‍රතිපාදන | 125,985,944.54 | | 116,047,416.23 | |
| වෙනත් ප්‍රතිපාදන | 42,496,995.95 | | 57,292,202.09 | |
| සම්මුච්චිත ලාභය/(පාඩුව) | (69,188,231.93) | | (84,594,935.88) | |
| | | 129,435,195.82 | | 118,885,169.70 |
| | | **129,435,195.82** | | **118,885,169.70** |

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

*2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | 2011<br>Rs. | 2010<br>Rs. |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම් *** | | |
| ආදායම් | 159,752,138.01 | 105,068,663.91 |
| අනිකුත් මෙහෙයුම් ආදායම් | 582,135.81 | 724,726.94 |
| පර්යේෂණ ප්‍රතිපාදන | 21,500,000.00 | 21,250,000.00 |
| | 181,834,273.82 | 127,043,390.85 |
| **මෙහෙයුම් වියදම් *** | | |
| කාර්ය මණ්ඩල | 94,431,614.60 | 75,271,903.22 |
| ගමන් යැපීම් දීමනා | 4,861,107.59 | 3,447,805.25 |
| සැපයුම් සහ පරිභෝජන වියදම් | 10,910,859.36 | 5,865,911.81 |
| අලුත්වැඩියා සහ නඩත්තු | 3,752,146.76 | 3,430,241.87 |
| ශිවිසුම් සේවා | 34,669,079.72 | 24,605,763.30 |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 13,907,760.39 | 9,291,672.08 |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | 162,532,568.42 | 121,913,297.53 |
| සම්පූර්ණ මෙහෙයුම් ලාභය/පාඩුව | 19,301,705.40 | 5,130,093.32 |
| කල්පසුවූ ගිණුම් | 25,000.00 | |
| | 19,326,705.40 | |
| මූල්‍ය පිරිවැය | (17,853.23) | (10,225.00) |
| මෙහෙයුම් නොවන වියදම් | (3,902,148.22) | (4,009,764.30) |
| සම්පූර්ණ මෙහෙයුම් නොවන ආදායම (වියදම) | (3,920,001.45) | (4,019,989.30) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/පාඩුව | **15,406,703.95** | **1,110,104.02** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල්** | | | |
| **වර්ෂය සඳහා ලාභය (පාඩුව)** | **15,406,704.00** | | |
| පර්යේෂණ ප්‍රතිපාදන | (21,500,000.00) | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | 458,109.00 | | |
| | (5,635,187.00) | | |
| **මුදල් නොවන හුවමාරු** | | | |
| ක්ෂයවීම් | 5,508,892.00 | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 3,412,498.00 | | |
| පාරිතෝෂික ගෙවීම් | (295,165.00) | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | (458,109.00) | | |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ආදායම් | **2,532,929.00** | 2,532,929.00 | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| ණයගැතියන්අඩුවීම (1991-2008) | 798,902.00 | | |
| පරිලේඛණ වැඩිවීම | (410,160.00) | | |
| නැවත අයවන ගෙවීම් වැඩිවීම | (45,000.00) | | |
| නොනිම් වැඩ වැඩිවීම | 3,957,899.00 | | |
| ණයගැතියන් අඩුවීම (2009-2011) | 4,120,732.00 | | |
| අයවිය යුතු විවිධ වැඩිවීම් - ප්‍රතිපාදන සහ ව්‍යාපෘති | (49,711,229.00) | | |
| තැන්පතු වැඩිවීම | (1,196,152.00) | | |
| අත්තිකාරම් අඩුවීම | 6,120,353.00 | | |
| පෙර ගෙවීම් වැඩිවීම | (199,768.00) | | |
| විවිධ ණයහිමියන් අඩුවීම | (15,969,618.00) | | |
| උපචිත වියදම් වැඩිවීම | 2,282,272.00 | | |
| අයවිය යුතු තැන්පතු වැඩිවීම | 1,389,906.00 | (48,861,863.00) | |
| **මෙහෙයුම් ක්‍රියාකරම් වලින් ලැබූ ශුද්ධ ලාභය** | | | **(46,328,934.00)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රමාණය** | | | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම් | | (31,079,180.00) | **(31,079,180.00)** |
| **මුදල් ක්‍රියාකාරකම්වලින් ලැබූ මුදල් ප්‍රමාණය** | | | |
| රාජ්‍ය ප්‍රතිපාදන (පර්යේෂණ සහ ප්‍රසම්පාදන) | | 44,650,000.00 | **44,650,000.00** |
| | | | **(32,758,114.00)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් සහ ද්‍රවශීල වත්කම්** | | | **42,593,764.00** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ ද්‍රවශීල වත්කම්** | | | **9,835,650.00** |

# ගිණුම් පිළිබඳ අදහස්

**1. මූලික ගිණුම්කරණ උපකල්පන**

(අ) දිගටම පැවැත්ම පිළිබඳ සම්බන්ධය
(ආ) ගිණුම් ප්‍රතිපත්ති අනුරූපිතව යොදා ගෙන ඇත
(ඇ) වර්ෂයට අදාල ගිණුම්ගත කල උපචිත ආදායම් හා වියදම්

**2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට යටත්ව අදහස් ඉදිරිපත් කර ඇත.**

(අ) රජයේ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි මිලදී ගැනීම් සඳහා ක්ෂයවීම් ගණනය කර ඇත්තේ 2009 වර්ෂයේ සිට සෑම වර්ෂයක් සඳහාම සැප්තැම්බර් 30 වන දින දක්වා පමණි. ඊට පසු කාලය සඳහා මිලදී ගැනීම්වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ ඊළඟ වර්ෂයේදීය.

නමුත් පර්යේෂණාගාර හා ක්ෂේත්‍ර උපකරණ, වාහන, ලී බඩු සඳහා ක්ෂයවීම් වර්ෂයේ ලාභ අලාභ ගිණුම් අනුව ගණනය කරන ලදී.

(ආ) වත්කම් ක්ෂය කිරීමේදී පහත ලෙස ස්ථාවර පිරිවැය ක්‍රමය අනුගමනය කරන ලදී.

| | % |
|---|---|
| ගොඩනැගිලි | 2.5 |
| යන්ත්‍ර සූත්‍ර හා විද්‍යාගාර උපකරණ | 20.0 |
| ලී බඩු හා සවිකර ඇති දේ | 10.0 |
| වාහන | 20.0 |
| සාමාන්‍ය | 20.0 |
| පොදු කාර්යාලීය උපකරණ | 10.0 |
| සැලසුම් කාර්යාල උපකරණ | 50.0 |
| පුස්තකාල උපකරණ | 5.0 |
| ගිනි නිවීම් උපකරණ | 10.0 |

(ඇ) වත්කම්වල ක්ෂයවීම් ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ 24 වන පරිච්ඡේදය අනුගමනය කරන රජයේ ප්‍රතිපාදන වලින් අඩුකර තිබේ.

(ඉ) අමුද්‍රව්‍ය නිකුත්කර ඇත්තේ පෙර ලැබීම් නිසා පෙර නිකුත් කිරීමේ පදනම මත අතර වටිනාකම් අවසාන මිළදී ගත් මිල මත තක්සේරු කර ඇත.

**3. ණයගැතියන්**

1987 සිට ණය එකතු කිරීම සඳහා ගත හැකි සියලු පියවර අනුගමනය කර ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව හා කළමනාකරණ හා විගණන කමිටුවේ අනුමැතිය මත 1987 සිට 2002 දක්වා ලැබිය යුතු ණය තොරතුරු නොමැතිවීම මත පොත් වලින් ඉවත් කර ඇත. එයට අයවැය දෙපාර්තමේන්තුවේද අනුමැතිය ලැබී ඇත.

| | |
|---|---|
| අන්තර්කාලීන කළමනාකරණ කමිටු පත්‍රිකා අංක. 2009-10-04 | 24,494.41 |
| අන්තර්කාලීන කළමනාකරණ කමිටු පත්‍රිකා අංක. 2010-01 | 133,049.21 |
| මුදල් රෙගුලාසි 113-2 | 1,731,555.87 |
| අන්තර්කාලීන කළමනාකරණ කමිටු පත්‍රිකා අංක. 2011-01-01 | 29,672.20 |

**4. ඇමුණුම් 20 A හි දී ඇති බොල්ණය සැපයීමේ පදනම**

**5. පාරිතෝෂික සඳහා වෙන්කිරීම්**

පාරිතෝෂික පනත පදනම්කර පාරිතෝෂික දීමනා වෙන්කිරීම් හා ගණන් බැලීම

**6. කල් පසුවූ ගිණුම්**

නැවත ගෙවිය යුතු තැන්පත් - මුදල් රෙගුලාසි 570 හා 571 අනුව ක්‍රියා කරන ලදී.

**7. නායයෑම් ආපදා අවමකරණ ව්‍යාපෘතිය**

දිගුකාලීන නායයෑම් ආපදා අවමකරණ ව්‍යාපෘතිය (2009-2011) "නුවරඑළිය, නුවර, මාතලේ සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි අධි අවදානම් නායයෑම් හා ගල් පෙරලීම් ස්ථානයන්හි ආපදා අවමකරණය සහ බැවුම් ස්ථායීකරණය" මේ සඳහා ප්‍රතිපාදන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා 2009 වර්ෂයේ සිට ලබා දෙන ලදී. මේ සඳහා ඇස්තමේන්තු මුලු මුදල රු. මිලියන 160.93 කි. නමුත් මේ සඳහා ගෙවූ මුදල 2009 වර්ෂය සඳහා මිලියන 36 කි. 2010 වර්ෂය සඳහා මිලියන 35 කි. නමුත් මෙම මුදල් අදාළ ආයතන මගින් ලබා නොදීම නිසා ව්‍යාපෘති කාල වකවානු වෙනස් කර 2012 වර්ෂය දක්වා දීර්ඝ කරන ලදී.

මුලු මෙහෙයුම් වියදම් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් කළ වියදම් තුළ අන්තර්ගත වේ. නායයෑම් ආපදා කලාපීය සිතියම් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 21.5 ක් සහ ආපදා අවමකරණ ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂය සඳහා රු. මිලියන 52 ක් ලබා ගන්නා ලදී. කෙසේ නමුත් රු. මිලියන 36 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සහ ආපදා සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 4 ක් 2011 නොවැම්බර් සහ දෙසැම්බර් කාලය සඳහා රු. මිලියන 6.5 ක් ප්‍රසම්පාදන වියදම් අදාළ ආයතන මගින් ලබා දී නොමැත.

**8. ඉදිකිරීම් සඳහා යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීම**

ජාතික ව්‍යසන කළමනාකරණ කමිටුව මගින් ජා.ගො.ප. සංවිධානයට නායයෑම් ආපදාවලට ගොදුරුවන ප්‍රදේශ සඳහා යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීමේ බලය පවරා තිබේ. මෙම කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා 2011 මාර්තු මාසයේ සිට නායයෑම් ආපදා පවතින දිස්ත්‍රික්ක 10 තුළ දිස්ත්‍රික් කාර්යාල පිහිටුවන ලදී. එනම් බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල අවශ්‍ය සියළුම පහසුකම් සහිතව කාර්යාල 2011 මාර්තු මස 01 දින සිට පිහිටුවා තිබේ. පසුගිය වර්ෂය පුරාවට යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීම දිගින් දිගටම සිදු කෙරිනි. මාසික මෙහෙයුම් වියදම රු. මිලියන 3.0 කි. මාර්තු සිට දෙසැ. දක්වා වියදම රු. මිලියන 30.0 කි. මෙම වියදම් මහා භාණ්ඩාගාරය මගින් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. කෙසේ නමුත් ජා.ගො.ප. සංවිධානයට අදාළ ප්‍රාදේශීය සභා මගින් සහ පුද්ගලයින් සඳහා යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීම මගින් රු. මිලියන10.6 ක ආදායමක් ලබා ගත හැකි විය.

# මානව සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය


ආයතනයේ වගකීම් වැඩිවීමත් සමගම මානව සම්පත් සහ පොදු කාර්යය සංවර්ධනය සඳහා පිරිවැටුම් ඉහළ යාම මෑත කාලයේ ආයතනයට ආවේනික දැරිය නොහැකි ප්‍රශ්නයක් විය.


ජා.ගො.ප. සංවිධානය ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදා අවමකරණය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයක් බවට පත්වී තිබේ. මේ නිසා නායයෑම් ආපදා අවම කිරීමේ ධාරිතාව වැඩිකිරීම සඳහා තීරණයක් ගෙන තිබේ. නායයෑම්වලට ගොදුරුවන ප්‍රදේශවල ආපදා අවමකරණය මිනුම් දණ්ඩක් ලෙස එම ප්‍රදේශවල ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම තුළින් බලාපොරොත්තු වේ. මේ සඳහා නායයෑම් ආපදාවලට ලක්වන දිස්ත්‍රික්ක 10 තුළ පිහිටුවා ඇති කාර්යාල සඳහා සේවක සංඛ්‍යාව 75 කින් වැඩිකිරීමට සිදුවී තිබේ.

මෙම වර්ෂයේදී නව බඳවා ගැනීමේ පරිපාටිය සහ උසස්වීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා තිබේ. මේ අනුව අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 274 ක් වේ. මෙම කාර්ය මණ්ඩල ප්‍රගතිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වේ. දේශීය සහ විදේශීය පුහුණුවීම් සඳහා ඉඩකඩ ලබාදීම තුළින් විද්‍යාඥයින්ගේ දැනුම සහ පළපුරුද්ද වැඩි දියුණු කිරීමට අවස්ථාව සලසා දී තිබේ.

ජා.ගො.ප. සංවිධානයේ අරමුණු හා අභිමතාර්ථ අමාත්‍යාංශයේ ආපදා අවම කිරීම සඳහා අවශ්‍ය ධාරිතාව වැඩිකරගැනීමට හැකිවන අයුරු ගොඩ නංවා තිබේ. මේ අනුව ආයතනය නීත්‍යානුකූල කිරීම සහ කාර්ය මණ්ඩල ගුණාත්මක බව ඉහළ දැමීම තුළින් ආයතනයේ අභියෝග ජය ගැනීමට බලාපොරොත්තු වේ. මේ සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීමද, රසායනාගාර උපකරණ සහ ක්ෂේත්‍රීය කටයුතු සඳහා අවශ්‍ය උපකරණ, දත්ත විශ්ලේෂණය සඳහා අවශ්‍ය මෘදුකාංග මිලදී ගැනීම සඳහා විදේශීය ත්‍යාග සහ ප්‍රතිපාදන ලබාගෙන තිබේ.


රාජ්‍ය ප්‍රතිපාදන 2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන වියදම් ලෙස රු. මිලියන 11 ක් ලබා ගෙන හූ තාක්ෂණික රසායනාගාර සඳහා අවශ්‍ය නවතම උපකරණ ලබාගෙන තිබේ. මහා භාණ්ඩාගාරය විසින් ආයතනයට ලබා දුන් ප්‍රතිපාදන ඉතාමත් ඵලදායී ලෙස භාවිතා කරමින් ආයතනයෙහි කාර්ය ධාරිතාව වර්ධනය සඳහා විදුම් උපකරණ සහ ගුණාත්මක් බවින් ඉහළ විද්‍යාගාර උපකරණ සහ අනිකුත් අත්‍යාවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගෙන තිබේ.



## විද්‍යුත් ප්‍රතිරෝධක සහ විකිරණ උපකරණ





**නායයෑම් සහ භූ විමර්ශන කටයුතු වැඩි දියුණු කර ගැනීම** සඳහා රු. මිලියන 11 ක රාජ්‍ය ප්‍රතිපාදන වියදම් කර නවීනතම විද්‍යුත් ප්‍රතිරෝධක උපකරණය මිලදී ගන්නා ලදී. මෙම නවීනතම උපකරණය පරිගනක ක්‍රියාකාරිත්වයෙන් සහ බහුකාර්යය විද්‍යුත් ක්‍රියාකාරිත්වයෙන් පරිපූර්ණය. මේ නිසා මෙම උපකරණය දත්තවල නිරවද්‍යතාවය වැඩිකර ගැනීමටත් සමීක්ෂණ කාලය ඉතිරි කර ගැනීමටත් උපයෝගී වේ. මෙම උපකරණය භාවිතා කර දැනට කරගෙන යන ආපදා අවමකරණ ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීමට හැකිවී තිබේ.



නායයෑම් සහ භූ විමර්ශන කටයුතු

මෙම ක්‍රමවේදය බෑවුම් අස්ථායීතාවය අධ්‍යයනය කිරීමට සහ එම ප්‍රතිඵල අනුසාරයෙන් බෑවුම් ස්ථායීකරණය සඳහා සැලසුම් සකස් කිරීමට උපයෝගී කර ගෙන යනු ලැබේ.

## ත්‍රි අක්ෂක වික්‍රියාව ගණනය කිරීමේ පරීක්ෂණ උපකරණය



මෙම උපකරණය මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රතිපාදන රු. මිලියන 5.0 ක් වියදම් කර තිබේ. මෙය අර්ධ ස්වයංක්‍රීය උපකරණයකි. භූතාක්ෂණික ක්ෂේත්‍රයේ ඉතා ඉහළ මට්ටමේ ත්‍රි අක්ෂික පර්යෙෂණ කටයුතු සඳහා යොදා ගනී. මෙම උපකරණය එක්සත් රාජධානියේ WYKEHAM FARRANCE නමින් නිෂ්පාදනය කර තිබේ. මෙහි ධාරිතාව මිලි මීටර 100 ක විශ්කම්භයක් තුළ නියැදියක් ඉතාමත් නිවැරදි ලෙස පරීක්ෂණය කළ හැකියි. තවද මෙම උපකරණය මගින් පරිගනක, තත්ත්ව පාලන, ත්‍රි අක්ෂික පරීක්ෂණ සහ භූගෝලීය විශේෂිත කරුණු පරීක්ෂණ සඳහා භාවිතා කළ හැකි අතර ප්‍රස්ථාර නිර්මාණය කළ හැකිවේ.

මෙම උපකරණය කඳුකර ප්‍රදේශවල බෑවුම් ස්ථායීතාව මැනීම සඳහා සහ නායයෑම් ආපදා අවමකරණ ව්‍යාපෘති කාර්යයන් සඳහා වඩාත් යෝග්‍ය වේ.

# ජාතික වැඩසටහන් සඳහා සහභාගී වීම

**<u>මොණරාගල පැවැත්වූ දැයට කිරුළ වැඩසටහන</u>**

මොණරාගල දිස්ත්‍රික්කයේ පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ජා.ගො.ප. සංවිධානයේ ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී. ඒ සඳහා විවිධ ආකෘතීන් හා පෝස්ටර් ප්‍රදර්ශනය කෙරුණු අතර ආයතනයේ සේවක සාමාජිකයන් විසින් ජා.ගො.ප. සංවිධානයේ කාර්ය භාරය හා නායයෑම් ආපදාවන් පිළිබඳ මහජනතාව දැනුවත්කරන ලදී.

# බඳවා ගැනීම් - 2011

| අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ඩී.බී. නිමල් ශාන්ත මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 2 | බී.වී.පී. ජයකොඩි මහතා | විද්‍යාඥ - ආයතනික සම්බන්ධීකරණ (කොන්ත්‍රාත්) |
| 3 | ඩබ්.ඊ. ප්‍රදීප් බුද්ධික මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 4 | එස්.ඒ.බී. ප්‍රනාන්දු මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 5 | ටී.ජී.පී. ලියනගම මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 6 | වී.පී. ධනුෂ්ක මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 7 | එච්.කේ.ඒ. කපිල සේනාරත්න මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 8 | කේ.එල්. රසික රුවන් කුමාර මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 9 | ඊ.වී. තිලකසිරි මහතා | අර්ධ පුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 10 | මහේෂිකා ගුරුසිංහ මිය | පරිපාලන නිලධාරි (කොන්ත්‍රාත්) |
| 11 | ජී.ඒ.එන්. පුෂ්පකුමාර මහතා | නුපුහුණු කම්කරු (කොන්ත්‍රාත්) |
| 12 | ඩබ්ලිව්. චමිල් ජනකාන්ත මහතා | රියදුරු - කොන්ත්‍රාත් |
| 13 | පී.එච්.සී.එස්. රත්නසිරි මහතා | විද්‍යාඥ - කොන්ත්‍රාත් |
| 14 | කේ.ආර්.කේ. අමරසේන මහතා | විගණන නිලධාරි (කොන්ත්‍රාත්) |
| 15 | එම්. නලීන් මධුසක මහතා | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 16 | එල්.ඒ. වයනි මෙනෙවිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 17 | එම්.ඩී.වී. උදයංග මහතා | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 18 | එල්.ඒ.පී. මධුමාලි මෙනෙවිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 19 | එල්.ජී.ඩී. නන්දන මහතා | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 20 | ආර්.එල්.පී.පී. ගීතිකා මෙනෙවිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 21 | ඩබ්.ජී.පී.යූ. කුමාර මහතා | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 22 | ජී.එස්.ඩබ්.එස්. පියුමාලි මිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 23 | පී.එන් ශ්‍යාමලී මෙනෙවිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 24 | පී.ජී.එන්. වික්‍රමරත්න මෙනෙවිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 25 | වයි.එස්. චන්ද්‍රරත්න මහතා | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 26 | එච්.එම්.එන්.කේ. හීන්කන්ද මෙනෙවිය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) |
| 27 | ආර්.එම්.ඩබ්. රත්නායක මිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 28 | ඒ. වනසුන්දර මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 29 | ආර්.ඩබ්.එම්.ඩී.ආර්. වනිගසේකර මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 30 | පී.ජී.ඒ.එන්. මහින්දවංශ මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |

| | | |
|---|---|---|
| 31 | ඊ.ඒ.එස්.එන්. විමලවර්ධනමහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 32 | යූ.එල්.එන්.අයි. ලියනගේ මෙනෙවිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 33 | ටී.පී.සී. මහේෂ් මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 34 | ඩී.ඒ.එස්.යූ. දසනායක මෙනෙවිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 35 | ඒ.යූ. විජේනායක මෙනෙවිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 36 | ජේ.ඩබ්.එම්.එම්.පී.කේ. ජයසිංහ මෙනෙවිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 37 | එච්.එච්. හේමසිංහ මෙනෙවිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 38 | ඩබ්.එන්.සී. අප්සරා මෙනෙවිය | විද්‍යාඥ/ ඉංජිනේරු (කොන්ත්‍රාත්) |

# විශ්‍රාම ගැනීම් - 2011

| අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ජී.එල්. චන්ද්‍ර සේන | තාක්ෂණික නිලධාරී |

# ඉල්ලා අස්වීම් - 2011

| අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ඩබ්.ඒ.එන්. ලක්මාලි කුලසේන | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 2 | එම්.ඩී.ඩී.බී. අබේකෝන් | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 3 | ඒ.ටී.ආර්. ප්‍රනාන්දු මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 4 | එච්.එම්.ඒ.සී. ජයකිත් මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 5 | එස්.එන්.එම්. වෙඩික්කාර | ඉංජිනේරු |
| 6 | එම්.එම්.පී. මදුරාවල මිය | ඉංජිනේරු |
| 7 | පී.එම්.ඩී.ජේ. පතිරාජ මහතා | ඉංජිනේරු |
| 8 | එස්. වසන්තන් මහතා | ඉංජිනේරු |
| 9 | ඩබ්.ඩී.ජේ. ෆොන්සේකා මහතා | තාක්ෂණික නිලධාරී |
| 10 | කේ.එම්.එස්. ප්‍රනාන්දු මහතා | ශෘහ නිර්මාණ ශිල්පී |
| 11 | එච්.සී.ඩී.පී. කොළඹගේ මහතා | විද්‍යාඥ |
| 12 | රසංග අල්විස් ඩයස් මහතා | රසායනාගාර සහකාර |
| 13 | සුනිල් ජයවීර මහතා | විද්‍යාඥ |
| 14 | ජී.එල්. චන්ද්‍රසේන මහතා | තාක්ෂණික නිලධාරී |
| 15 | ඩී.එන්.එස්. වන්නිආරච්චි මහතා | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 16 | තිළිණි පීරිස් මෙනෙවිය | විද්‍යාඥ (කොන්ත්‍රාත්) |
| 17 | ගාමිණී කෝදාගොඩ මහතා | තාක්ෂණික නිලධාරී |
| 18 | ජේ.ආර්.පී. පුෂ්පකුමාර මහතා | නුපුහුණු කම්කරු |

# විදේශ පුහුණුවීම් – 2011

| අංකය | නම | පුහුණුවීම්/වැඩමුළු/සම්මන්ත්‍රණ | රට | කාලය |
|---|---|---|---|---|
| 1 | ආර්.එම්.එස්. බණ්ඩාර මහතා | Regional Capacity Enhancement for landslide Impact Mitigation (RECLAM) | බංග්ලාදේශය | 2011 මාර්තු 8 - 11 |
| 2 | කේ.සී. සුගතපාල මහතා | Technical Consultation on Toolkit for Disaster Recovery Practitioners | තායිලන්තය | 2011 අප්‍රේල් 5 |
| 3 | එච්.ආර්. මධුරංග මහතා | SAARC Training Programme on Landslide Risk Management | කත්මන්ඩු | 2011 මැයි 2 – 8 |
| 4 | කේ. සෙනෙවිරත්න මහතා | Training Course on Elements of Seismic Monitoring techniques for Developing Countries | චීනය | 2011 ජූනි 9- 29 |
| 5 | එස්.ඒ.එම්.එස්. දිසානායක මිය | Water, Engineering and Development Centre (WEDC) 35th International Conference | Loughborough , එක්සත් රාජධානිය | 2011 ජූලි 5 - 8 |
| 6 | ආචාර්ය එච්.ඒ.ජී. ජයතිස්ස | International Conference "Applied Geoinformatics for Society and Environment (AGSE) | නයිරෝබි, කෙන්යා | 2011 අගෝස්තු 15 – 19 |
| 7 | කේ.සී. සුගතපාල මහතා | Technical Consultation on Toolkit for Disaster Recovery Practitioners | තායිලන්තය | 2011 සැප්තැම්බර් 2 |
| 8 | කේ.එම්. වීරසිංහ මිය | The Second World Landslide Forum | ඉතාලිය | 2011 ඔක්තෝබර් 1 – 9 |
| 9 | ආර්.එම්.එස්.බණ්ඩාර මහතා | Resource Person for the SAARC Incident Command System (ICS) | නේපාලය | 2011 සැප්තැම්බර් 22 -30 |
| 10 | එච්.එම්.එල්. ඉන්ද්‍රතිලක මහතා | Training Workshop on "Incident Command System" | නේපාලය | 2011 සැප්තැම්බර් 26 – 30 |
| 11 | එම්.ඩී.සී.පෙරේරා මහතා | Training Resilient Recovery UN ISDR Global Education and training Institute for Disaster Risk Reduction (GETI) and International Recovery Platform (IRP) | කොරියාව | 2011 ඔක්තෝබර් 17 – 19 |
| 12 | ආර්.එම්.බී. සෝමරත්න මහතා | Counterpart Training Programme under DIMCEP Prlect | ජපානය | 2011 ඔක්තෝබර් 20 - නොවැම්බර් 5 |
| 13 | එම්.ආර්.එන්.සී. වීරසිංහ මහතා | AUS AID Public Sector Linkage Programme - Capacity Building on Disaster management in SL | ඕස්ට්‍රේලියාව | 2011 නොවැම්බර් 2 – 10 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | ආර්.එම්.එස්. බණ්ඩාර මහතා කේ.එම්. වීරසිංහ මිය | The fifth Governing Board Meeting of the SAARC Disaster Management Centre | ඉන්දියාව | 2011 නොවැම්බර් 16 – 17 |
| 15 | ආර්.එම්.එස්. බණ්ඩාර මහතා | National Initiatives of Promotion of Earth Warning Mechanisms for Landslides Risk Management under RECLAIM Phase III | බංග්ලාදේශය | 2011 දෙසැම්බර් 3 – 7 |
| 16 | ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන | Disaster Risk Reduction in Asia, Identifying and minimizing opportunities for Action | තායිලන්තය | 2011 නොවැම්බර් 12 – 14 |
| 17 | ආචාර්ය එච්.ජී.ජී. ජයතිස්ස සුනිල් ජයවීර මහතා | Training of Trainers "Ecosystem based Disaster Risk Reduction for Sustainable Development" | තායිලන්තය | 2011 දෙසැම්බර් 6 – 8 |

# දේශීය පුහුණුවීම් – 2011

| අංකය | නම | පුහුණුවීම් | ආයතනය | කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | එම්.එම්.ජී. මදුරාවල මිය | ISO/SEC 17025 - 2005 Internal Auditing & Laboratory Management System | SLAB | 20.01.2011 - 21.01.2011 |
| 2 | බී.එම්.ආර්.කේ.බාලසූරිය මහතා | National Symposium on Disaster: reduction Mitigation and Management | SLGS | 25.02.2011 - 26.02.2011 |
| 3 | එල්.ජී.ටී.එල්. පෙරේරා මහතා | Development of Quality Manual and Operating Procedures based on ISO/IEC 170205:2005 | SLAB | 23.02.2011 - 24.02.2011 |
| 4 | කේ.එම්.එස්. ප්‍රනාන්දු මිය | National Conference on Architecture Annual Sessions | ශ්‍රී ලංකා පරිපාලන ආයතනය | 24.02.2011 - 27.02.2011 |
| 5 | ජේ.කේ. ජයවර්ධන මිය<br>එස්.වී. ඩයස් මිය<br>එම්. දිසානායක මිය<br>ආර්. සවිතා මිය<br>වී.අයි. නන්තිනී මිය<br>එච්.ආර්. මදුරංග මහතා<br>බී.එම්.ඒ. බස්නායක මිය<br>පී.බී.එස්.එස්.ඒ. වික්‍රමසිංහ මහතා | Workshop on Effective Proposal Writing | ජාතික විද්‍යා පදනම | 25.02.2011 |
| 6 | එම්.ඩී.සී. පෙරේරා මහතා | World Meteorological Day | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 23.03.2011 |

| | | | | |
|---|---|---|---|---|
| 7 | එච්.ජී.එස්. ආරියරත්න මහතා | Human Resources Development through Disciplinary Management | CSDM | 11.03.2011 - 12.03.2011 |
| 8 | එන්. වීරසිංහ මහතා | Disaster Management Training Programme | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | |
| 9 | ආර්.එම්.එස්. බණ්ඩාර<br>ආර්.එම්.බී. සෝමරත්න<br>කේ.එම්.ඩී.එල්.ටී. පීරිස් මහතා | Annual General Meeting and Technical Sessions | GSSL | 25.02.2011 |
| 10 | කේ. ජයවර්ධන මිය<br>සවිතා මිය | Disaster resistant Building for SL | මොරටුව විශ්ව විද්‍යාලය | 05.05.2011 - 08.05.2011 |
| 11 | ආර්. තුඩුගල මිය<br>ඩබ්.ඩබ්. නදීකා මෙනෙවිය | New Developments in TAX LAWS | Skills Development Fund Ltd. | |
| 12 | ජේ.එම්. ගුරුසිංහ මිය | Workshop on SOR and Promotion Schemes | ICTAD | 18.06.2011 |
| 13 | ආර්. තුඩුගල මිය<br>කේ. අමරසේන මයා | How to minimise audit quarries in Govt. organisations | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 14.09.2011 - 15.09.2011 |
| 14 | ආචාර්ය එච්.ඒ.ජී. ජයතිස්ස<br>එස්.කේ. මුතුරත්න මිය<br>එස්.ඒ.එම්.එස් දිසානායක මිය එච්.ඩී.එස්. ප්‍රේමසිරි මහතා | Training workshop on Foresight Analysis | ජාතික විද්‍යා පදනම | 27.09.2011 - 29.09.2011 |
| 15 | එස්. ඩයස් මිය<br>ඩයාන් මුණසිංහ මයා<br>එම්.ඩී.ඩී.එස්. ප්‍රේමසිරි මහතා<br>ඒ. බස්නායක මිය | Training Programme on Preparation of Greenhouse Gas Inventory | පරිසර අමාත්‍යාංශය | 9.2011 |
| 16 | ජේ.කේ. ජයවර්ධන මිය<br>පී. ධර්මසේන මහතා<br>එච්.ආර්. මදුරංග මහතා<br>පී.එම්.ඩී.ජේ. පතිරාජ මහතා<br>පී.එච්.සී.එස්. රත්නසිරි මහතා | Urbanization, Climate Change and minimisation of Disaster Effects | SEC | 28.09.2011 |
| 17 | ආචාර්ය එච්.ඒ.ජී. ජයතිස්ස<br>කේ.එම්. වීරසිංහ මිය<br>පී. ධර්මසේන මහතා | Workshop on Fundamentals of Project Management | NSTC | 28.09.2011 |
| 18 | ආර්.එම්.එස්. බණ්ඩාර මහතා<br>කේ. එම්. වීරසිංහ මිය<br>එම්.අයි.ඩී.එච්. විජේවික්‍රම මහතා | Use of Space technology for Disaster Management | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | 17.10.2011 - 21.10.2011 |
| 19 | කේ.එම්.ඩී.එල්. පීරිස් මෙනෙවිය | Monsoon Forum | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 04.11.2011 |

# අංශයන්හි ප්‍රගතිය

## 1. නායයෑම් අධ්‍යයන හා සේවා අංශය

නායයෑම් අධ්‍යයන හා සේවා අංශය වාර්තා කරන ලද කාල වකවානුව වන 2011 වර්ෂය සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන්හි මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී.

1. නායයෑම් ආපදා කලාප සිතියම්ගතකරණය
2. නායයෑම් අවමකරණ කටයුතු
3. නායයෑම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු කිරීම්
4. නායයෑම් පිළිබඳ පූර්ව දැනුම් දීම්
5. විශේෂ භූ විමර්ශන කටයුතු
6. නායයෑම් පිළිබද පර්යේෂණ
7. නායයෑම් ආපදා ප්‍රදේශවල සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම

**i. නායයෑම් ආපදා කලාප සිතියම්කරණය**

අංශයෙහි ප්‍රධාන කාර්යභාරය ලෙස නායයෑම් ආපදා කලාප සිතියම්කරණය නිරන්තරව සිදු කරනු ලබන අතර මෙම වර්ෂයේ කළුතර, නුවරඑළිය සහ ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි රාජ්‍ය ප්‍රතිපාදන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මගින් ලැබු ප්‍රතිපාදන මගින් ව්‍යාපෘතියේ වැඩ කටයුතු කරගෙන යන ලදී. 1:10,000 පරිමාණයට කළුතර දිස්ත්‍රික්කයෙහි සිතියම් ගත කිරීම සඳහා වූ මුළු ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 640 න් වර්ග කිලෝ මීටර් 420 ක් සිතියම් ගතකර තිබේ. 1:50,000 පරිමාණය යටතේ නායයෑම් ආපදා කලාප සිතියම්ගතකරණය ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල රජයේ ප්‍රතිපාදන මගින් 95% ක ප්‍රමාණයක් සම්පූර්ණ කර තිබේ

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා ප්‍රතිපාදන ලබාගෙන නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආපදා කලාපීය සිතියම් වර්ග කි.මී. 440 ක් සහ වර්ග කි.මී. 400 ක ගාල්ල දිස්ත්‍රික්කය සඳහා සම්පූර්ණ කර තිබේ. මෙම සියලුම සිතියම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට භාර දී තිබේ.

**ii. නුවරඑළිය, මහනුවර, මාතලේ සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි අධි අවදානම් නායයෑම් හා ගල්පෙරළීම් ස්ථානයන්හි ආපදා අවමකරණය හා බෑවුම් ස්ථායිකරණය**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් රජයේ ප්‍රතිපාදන සඳහා යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා අනුව පහත සඳහන් නායයෑම් අවමකරණ ක්‍රියාකාරකම් සිදුකරමින් පවතී.

(අ) **නායයෑම් අවමකරණ ව්‍යාපෘතිය -** පේරාදෙණිය නායයෑම් ආපදා අවමකරණයේ පළමුවන අවස්ථාව සාර්ථකව නිම කිරීම ප්‍රතිපලයක් ලෙස මහනුවර කොළඹ ප්‍රධාන මාර්ගය යලි ගමනාගමනය සඳහා මහජනතාව වෙනුවෙන් විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු බෑවුම් කැනීම් වර්ග කි.මී. 2500 ක් තද කර එම ප්‍රදේශය සඳහා අවශ්‍ය කානු පද්ධතිය සකස් කරමින් පවතී. ව්‍යපෘති භූමියේ මුළු දිග ප්‍රමාණයෙන් 75% ක් සම්පූර්ණ කර තිබේ. පහළ බෑවුමේ මතුපිටට නිරාවරණය වී ඇති කොටස රසායනික පිපිරවීම් මගින් එහි හැඩය පැහැදිලි කර ගැනීම සඳහා නැවත සකස් කර තිබේ.

(ආ) **පදියපැලැල්ල නගරය ප්‍රදේශයේ නායයෑම් අවමකරණය ක්‍රියාවලිය**

මෙම වර්ෂය තුළද පදියපැලැල්ල නායයෑම් ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. පහළ සහ මධ්‍යම ප්‍රදේශ රැඳවුම් බැම් ඉදිකිරීම ආරම්භ කර තිබේ. පහළ රැඳවුම් බැම් මීටර් 60 ක ප්‍රමාණයක් එනම් 80% ක් සහ මධ්‍යම කොටසින්

මීටර් 50 ක් එනම් 62% ක් සම්පූර්ණ කර තිබේ. රැඳවුම් බී තාප්පය ඉදිකර අවසන් කර තිබේ. ඉතිරි වැඩ කෙරෙමින් පවතී.

**(ඈ) මාතලේ ප්‍රදේශයේ භූමි ගිලාබැසීම සම්බන්ධ අධ්‍යයනය**

මාතලේ ප්‍රදේශයේ භූමිය ගිලා බැසීම සම්බන්ධ අධ්‍යයන කටයුතු අවසන් කර ඒ සඳහා අවසන් වාර්තාව සකස් කරමින් පවතී. ගිලා බැසීම් සම්බන්ධ ප්‍රදේශය ආවරණය වන පරිදි සිතියම් පිළියෙල කර ඇත. දිස්ත්‍රික්කයෙහි රාජ්‍ය හා රාජ්‍ය නොවන අදාල ආයතන වෙත මෙම සිතියම් බෙදා හැර ඇත. එසේම මෙම ගිලාබැසීම සම්බන්ධව දැනුවත් කිරීම් පත්‍රිකාද සකස්කර අදාල අංශ වෙත බාර දී තිබේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සකස්කරන ලද මිණුම් උපකරණ සවි කිරීමෙන් පසු භූමියේ ඉරිතලා යෑම් මැනීම සිදුකෙරෙමින් පවතී.

**(ඇ) නායයෑම් ආපදා කලාප සිතියම් සමග බදුල්ල දිස්ත්‍රික්කයෙහි ඉඩම් පරිහරණ සිතියම් ඇගයීම**

මෙම වසර පුරා මෙම ප්‍රදේශය තුළ ඇගයීම් කටයුතු කෙරෙමින් පවතී. ක්ෂේත්‍රීය සිතියම් සම්පූර්ණයෙන්ම නිම කර තිබේ.

**iii. නායයෑම් පිළිබඳව දැනුවත් කිරීම් හා පුහුණු කිරීම.**

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, විශ්ව විද්‍යාල අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය, අන්තර් ජාතික සංවර්ධන අරමුදල, රතුකුරුස සංවිධානය, ආසියා පදනම ආදී රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානය විසින් සංවිධානය කරන ලද නායයෑම් සම්බන්ධ වැඩමුළුවලදී අංශයෙහි සම්පත් දායකයින් යොදාගෙන දැනුවත් කිරීම් සිදුකරන ලදී. නමුත් මෙම වර්ෂය තුළ ආයතනීය ප්‍රතිපාදන නොමැති බැවින් ආයතනය විසින්ම දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම තාවකාලිකව නතර කර තිබේ.

(ආ) විශ්ව විද්‍යාල හා පාසැල් වලින් ව්‍යාපෘතීන් හා පශ්චාත් උපාධි සඳහා පැමිණෙන සිසුන් 38 කට වැඩි පිරිසකට ව්‍යාපෘති වාර්තා සඳහා තොරතුරු ලබා දී තිබේ.

**iv. නායයෑම් පිළිබඳව පූර්ව දැනුම් දීම**

**නායයෑම් පිළිබඳව පූර්ව දැනුම් දීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ජා.ගො.ප. සංවිධානයෙහි නායයෑම් අධ්‍යයන හා සේවා අංශය වසර පුරාම අවශ්‍ය අවස්ථාවන්හිදී පූර්ව දැනුම් දීම් ලබා දෙන ලදී.** ශ්‍රී ලංකාවේ නායයෑම් ප්‍රදේශ ආවරණය වන පරිදි ස්වයංක්‍රීය වර්ෂාමාන 100 ක් සවි කිරීමට ව්‍යාපෘති වාර්තාවන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල වෙත අංශය විසින් ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව දැනට පිළිගෙන ඇති අතර ඒවා මිලදී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙක් සොයා ගැනීමට ටෙන්ඩර්පත් කැඳවා ඇත. මෙම ස්වයංක්‍රීය වර්ෂාමාන සවි කිරීමෙන් පසුව වඩාත් නිවැරදිව අවදානම් ප්‍රජාව වෙත නායයෑම් පිළිබඳව පූර්ව අනාවැකි ලබා දීමට අංශයට හැකි වේ.

**v. විශේෂ විමර්ශන**

නායයෑම් අධ්‍යයන හා සේවා අංශය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙහිම සේවා දායකයින් වෙත අදාළ භූමි ප්‍රදේශයන් විශේෂ විමර්ශනයට ලක්කර නිසි නිර්දේශ සහිතව විස්තරාත්මක වාර්තාවක් සැපයීමේ සේවාව සිදු කරයි. කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය වැනි ජාතික ව්‍යාපෘතීන් සඳහා ද විශේෂ විමර්ශන සිදුකර විස්තරාත්මක වාර්තාවක් සපයා ඇත. මේවාට ද අමතරව පසුගිය වසර තුළ කළුගල් කැඩීමේ ව්‍යාපාර, කුඩා පරිමාණ සරල විදුලි ව්‍යාපෘති ඉඩම්වල උප බෙදුම් ව්‍යාපෘති, මැණික් පතල් ස්ථාන, පස් ඉවත් කිරීමේ ව්‍යාපෘති,නිවාස ඉදිකිරීම් ස්ථාන ආදිය සඳහා වාර්තා ලබා දී ඇත.

| අංකය | දිස්ත්‍රික්කය | විමර්ශන සේවා | උපදේශක |
|---|---|---|---|
| 01 | බදුල්ල | 120 | 66 |
| 02 | කොළඹ | 15 | 46 |
| 03 | ගාල්ල | 20 | 54 |
| 04 | ගම්පහ | 0 | 06 |
| 05 | හම්බන්තොට | 01 | 02 |
| 06 | කලුතර | 60 | 48 |
| 07 | නුවර | 118 | 583 |
| 08 | කෑගල්ල | 184 | 346 |
| 09 | කුරුණෑගල | 03 | 05 |
| 10 | මාතලේ | 88 | 124 |
| 11 | මාතර | 13 | 59 |
| 12 | නුවරඑළිය | 36 | 56 |
| 13 | රත්නපුර | 40 | 29 |
| | එකතුව | 698 | 1424 |

*විශේෂ විමර්ශන ලැයිස්තුව දිස්ත්‍රික් වශයෙන් - 2011*

**vi. විශේෂ ව්‍යාපෘති**

ගැරඩිඇල්ල නායයෑම් ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ විමර්ශන කටයුතු 2011 අගෝස්තු මස සිට ආරම්භ කර තිබේ. භූ විදුම් 4 ක කටයුතු නිම කර තිබේ. ප්‍රතිරෝධන මිනුම් කටයුතු නවතම මිලදී ගත් ප්‍රතිරෝධන උපකරණය භාවිතා කරමින් පර්යේෂණ කටයුතු කරන ලදී. මෙම උපකරණය මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 5 ක් ප්‍රසම්පාදන ලෙස ලබා දී තිබේ. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ප්‍රතිපාදන ලබා ගෙන මහවැව, වලපන, ගලබොඩ සහ රත්නපුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා වැඩිදුර අධ්‍යයන කටයුතු ආරම්භ කර තිබේ. සියළුම අධීක්ෂණ උපකරණ මෙම ව්‍යාපෘති භූමි තුළ 2010 වර්ෂයේදී ස්ථානගත කර තිබේ. මෙම වර්ෂයේද අධීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී.

මෙහි ප්‍රතිඵල අනුව ආපදා අවමකරණ ව්‍යාපෘතියක් ගලබොඩ නායයෑම් ආපදා ප්‍රදේශය සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතන කණ්ඩායම සහ ජා.ගො.ප.ස. කණ්ඩායම හඳුන්වා දී තිබේ.

**vii. පර්යේෂණ කටයුතු**

මෙම වර්ෂයේ පර්යේෂණ කටයුතු සඳහා විශේෂ අවධානයක් යොමු කර නොමැත. ඊට හේතුව ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන නොලැබීම සහ පර්යේෂණ කාර්යයන් සඳහා අවශ්‍ය පුද්ගලයන් හිගවීම නිසයි. නමුත් නායයෑම් ආපදා සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව නියමිත කාල පුරෝකථනය කිරීම සහ නායයෑම් ආපදා අවමකරණ කටයුතු අදාළ කරගෙන සාර්ථක ආපදා අවම කරන ක්‍රමවේදයන් සහ නායයෑම් ආපදා පිළිබඳ පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදයන් සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂණය කර පර්යේෂණ කටයුතුවල නිරත වී සිටී.

**viii. නායයෑම් ආපදා ප්‍රදේශවල ඕනෑම ඉදිකිරීම් කටයුත්තක් සඳහා යෝග්‍යතා සහතික සහ වාර්තා නිකුත් කිරීම**

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් තුමිය විසින් නායයෑම් ආපදා කලාපවල කෙරෙන සියලු ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා යෝග්‍යතා සහතිකයක් ලබා ගත යුතු බව දන්වමින් 2011 පෙබරවාරි 15 වන දින චක්‍රලේඛනයක් නිකුත් කර තිබේ. මේ සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජා.ගො.ප. සංවිධානය ප්‍රාදේශීය කාර්යාල 9 ක් බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි 2011 මාර්තු 01 වන දින සිට අවශ්‍ය පහසුකම් සහිතව පිහිටුවා තිබේ. මෙම කාර්යාල මගින් 2011 වසර සඳහා යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීම දිගින් දිගටම ක්‍රියාත්මක විය. 2011 වර්ෂයේ මාර්තු 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර 12,331 ක් ඉදිරිපත් කර තිබුනි. මින් 11,485 ක් සඳහා විමර්ශන කටයුතු සම්පූර්ණ කර තිබෙන අතර 9,995 ක් සඳහා යෝග්‍යතා සහතික නිකුත් කර තිබේ.

## 2. පාරිසරික අංශය

### 2.1 අනුග්‍රාහක පර්යේෂණ හා උපදේශක සේවා

අංශය ආදායම් උපයනු ලබන්නේ අනුග්‍රාහක පර්යේෂණ සේවා වලින්ම සිදු කරනු ලබන උපදේශන සේවාවන් මගිනි. (ජලයෙහි ගුණාත්මක බව, දූෂිත ජලය පස්, අවසාදිත, ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි කෘෂි රසායනික පරීක්ෂණ, වායු තත්ත්ව හා ශබ්ද දූෂණයේ තත්ත්ව, යම් යම් වකවානුන්හි පරිසර විමර්ශන සහ පරිසර අධ්‍යයන ආදී)

### 2.2 පර්යේෂණ ව්‍යාපෘති

**කැළණි ගඟ ඉහළ ජල පෝෂක ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය හා ජල සම්පත ආශ්‍රිත තොරතුරු පද්ධතියක් සකස් කිරීම**

කැළණි ගඟේ ඉහළ ජල පෝෂක ප්‍රදේශය තෝරාගෙන ඒ සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස මෙහි ප්‍රතිඵල පදනම් කරගෙන මෙම ප්‍රදේශයේ ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය අධ්‍යයනය කිරීමට අවශ්‍ය අධීක්ෂණ වැඩසටහනක් සකස් කරන ලදී. මෙමගින් ප්‍රජාව නිසා වන බලපෑම් සහ එය කළමනාකරණය පිළිබඳ අධ්‍යයන කටයුතු කරන ලදී.

අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරා විහිදී යන වර්ග කි.මී. 407 යුක්ත ග්‍රාම නිලධාරී වසම් 54 කින් ආවරණය වන භූමි ප්‍රමාණයක් මෙම අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ (UNDP) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) මූල්‍යමය දායකත්වය සහ අධීක්ෂණ සේවා සපයනු ලබයි. මේ වන විට ජලාධාර ප්‍රදේශ කළමනාකරණ සම්බන්ධයෙන් ඇති පසුගිය අධ්‍යයනයන් පිළිබඳ විමර්ශන වාර්තා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

විවිධ ආයතනයන් හා ප්‍රජා සංවිධානයන් දත්ත එකතු කිරීමේ කාර්යයේදී මෙම අධ්‍යයනය සඳහා සහාය දන්වනු ලැබිය. ලබා ගන්නා ලද දත්ත පරිපාලන, සම්පත් (වන රක්ෂණ, වනජීවි) කෘෂිකාර්මික හා වාණිජ වගාවන්, භූමි භාවිතය, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව ජල සම්පත් භාවිතයෙන් කෙරෙන ප්‍රධාන සහ සුළු ප්‍රමාණයේ ජල විදුලි ව්‍යාපෘතියෙන්, ව්‍යාසනයන් හා කර්මාන්ත ශාලා යනාදී වශයෙනි.

මෙම ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී දායකත්වය සපයන ආයතනයන් හා ප්‍රජා සංවිධානයන් පිළිබඳව තොරතුරු ඇතුළත් දෙවැනි වාර්තාව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP) සඳහා යොමු කරන ලදී.

- උපදේශන ව්‍යාපෘතිය - පදියපැලැල්ල නායයෑම් අවමකරණ ව්‍යාපෘතියේ පරිසර සැළසුම්කරණය (කාලසීමාව 2010-2011)

ජා.ගො.ප.සංවිධානයෙහි නායයෑම් අධ්‍යයන අංශයේ මූලිකත්වයෙන් පදියපැලැල්ල නායයෑම් අවමකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවිය හැකි පරිසර හානිය අවම කිරීම සඳහා පාරිසරික

කළමනාකරණ සැලැස්මක් සහ ඒවා අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබද සැලැස්මක් පරිසර අංශය විසින් සකස් කර තිබේ.

## 3. ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය

ගොඩනැගිලි ද්‍රව්‍ය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, තත්ත්ව පාලන ක්‍රියා සඳහා සේවා ලබා දෙයි. ඒවගේම මෙම ක්ෂේත්‍රයට අදාළ දැනුවත් කිරීම් සහ පුහුණු කිරීම් කටයුතු කරනු ලබන අතර ඒ පිළිබඳ පර්යේෂණ කටයුතුවල නිරත වේ. උතුරු පළාත් සභාවේ ඉල්ලීම පරිදි ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂණ පිළිබඳ ඉංජිනේරුවන් හා තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම අංශය ඉදිකිරීම් කර්මාන්තයේ පර්යේෂණ සහ ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා අවශ්‍ය නවතම පර්යේෂණ උපකරණවලින් සමන්විත වේ. කොන්ක්‍රීට් මිශ්‍රනය, ගොඩනැගිලිවල ධාරිතාව පරීක්ෂා කිරීම

1. සම්පූර්ණ කරන ලද පර්යේෂණ හා උපදේශන සේවා

| කාර්යය | සිදුකරන ලද උපදේශන පරීක්ෂා සංඛ්‍යාව |
|---|---|
| 1. කොන්ක්‍රීට් පරීක්ෂාව<br>2. වැරගන්වන සහ යකඩ පරීක්ෂාව<br>3. අනෙකුත් පරීක්ෂණ | 1645<br>299<br>404 |
| එකතුව | 2348 |

පර්යේෂණ අධ්‍යයන

- දැනට කියුබ් පරීක්ෂණ තුළින් ලබා ඇති දත්ත විශ්ලේෂණය කර උපදේශන සේවා සඳහා අවශ්‍ය වැඩිදුර අධ්‍යයන කටයුතු කිරීම
- පර්යේෂණාගාර තොරතුරු ආශ්‍රය කරගෙන වැඩිදුර අධ්‍යයන කටයුතු කිරීම

## 4. භූ තාක්ෂණික ඉංජිනේරු අංශය

නායයෑම් ආපදා අවම කිරීම සඳහා භූ තාක්ෂණික ඉංජිනේරු අංශය පර්යේෂණ කරනු ලැබේ. අංශයෙහි ප්‍රධාන ක්‍රියාවලීන් ලෙස භූ තාක්ෂණික විමර්ශන, සැළසුම් හා උපදේශන සේවා දැක්විය හැකිය. භූ තාක්ෂණික ඉංජිනේරු අංශය විසින් විශාල ප්‍රමාණයක් ක්ෂේත්‍ර හා විද්‍යාගාර පරීක්ෂණ සිදු කරයි. නායයෑම් ප්‍රදේශයන්හි අස්ථාවර බෑවුම්වල පාංශු ස්ථරවල හැසිරීම සහ දිවයිනෙහි සමහර ප්‍රදේශයන්හි පවතින වගුරුබිම්වල පාංශු ස්ථරවල හැසිරීම ආදිය මුල් තැනක් ගනී.

භූ තාක්ෂණික ඉංජිනේරු අංශයෙහි පර්යේෂණාගාරය ක්ෂේත්‍ර පර්යේෂණයන් සඳහා යෝග්‍ය උපකරණයන් ගෙන් සමන්විත වේ.

භූ තාක්ෂණික විමර්ශන ව්‍යාපෘති

| ව්‍යාපෘති අංකය | විස්තරය | සේවා දායකයා |
|---|---|---|
| 23956 | ගැරඩිඇල්ල නායයෑම් ආපදා ව්‍යාපෘතිය සඳහා භූ විමර්ශන කටයුතු | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය/ නායයෑම් අධ්‍යයන හා සේවා අංශය |
| 23655 | ත්‍රිකුණාමලය වරාය සඳහා භූ විමර්ශන කටයුතු | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 23779 | නිවිතිගල නගරයේ සංවර්ධන ව්‍යාපෘතිය | නිවිතිගල ප්‍රාදේශීය සභාව |
| 23816 | ඌව පළාතේ මහජන සේවා කොමිසම සඳහා තට්ටු පහකින් යුත් යෝජිත ගොඩනැගිල්ල සඳහා භූ විමර්ශන කටයුතු | ඌව පළාත් සභාව |
| | | |
| 23252 | දකුණු පළාත් ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘති භූ තාක්‍ෂණ විමර්ශන සඳහා ඉදිකිරීම් අධීක්‍ෂණය - කොට්ටාව | ඔරියන්ටල් කන්සල්ටන්ට් කම්පැණි ලිමිටඩ් |
| 23252.37A | දකුණු පළාත් ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘති භූ තාක්‍ෂණ විමර්ශන සඳහා ඉදිකිරීම් අධීක්‍ෂණය කොට්ටාව (STDP-JBIC)- කුරුඳුගහහැතැක්ම | සම්පත් සංවර්ධන උපදේශන ආයතනය |
| 23755 | කොළඹ මලාපවාහන ස්ථානයේ භූගෝලීය සමීක්ෂණ සහ භූ විමර්ශන කටයුතු | කොළඹ මහ නගර සභාව |
| 23795 | නිවාස ව්‍යාපෘති සඳහා පස් පරීක්ෂණ කටයුතු - සලමුල්ල | ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධන ආයතනය |
| 23814 | අච්චුවේලි කර්මාන්ත පුරවරයේ යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘතියේ පස් පර්යේෂණ | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය |
| 23830 | ආරක්ෂක අමාත්‍යාංශයේ සහ ත්‍රිවිධ හමුදාවේ මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා පර්යේෂණාගාර පහසුකම් සැපයීම - අකුරේගොඩ, බත්තරමුල්ල | ආරක්ෂක අමාත්‍යාංශය |

## 5. ව්‍යාපෘති කළමනාකරණ අංශය

ව්‍යාපෘති කළමනාකරණ අංශය සේවා දායකයින් සඳහා ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණයේදී ඒවා ප්‍රමිතියෙන් යුක්තව වියදම කාලය නාස්ති නොවන අයුරින් නිම කිරීමට දායක වේ. වැඩිදුරටත් ඉඩම් ගොඩ කිරීමේ කාර්යයන්හිදී එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය සේවා සපයනු ලැබිණ.

### 5.1 රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයෙහි ඉදිකිරීම් හා ඊට අදාල ව්‍යාපෘතීන් සඳහා උපදේශන සේවා සැපයීම

- ගෘහ නිර්මාණ, ව්‍යුහාත්මක, සේවා සැපයීම සඳහා සැළසුම් කිරීම හා සකස් කිරීම
- ටෙන්ඩර් පත් සැකසීම, ටෙන්ඩර් කැඳවීම, ටෙන්ඩර් විශ්ලේෂණය හා සුදුසු ටෙන්ඩර්කරුවන් තෝරා ගැනීම
- තත්ත්ව පාලනය, ඉදිකිරීම් කාලය තුළ ඉදිකිරීම් පරීක්ෂාවට ලක් කිරීම, ගෙවීම් සඳහා ඉදිකිරීම් සහතික කිරීම ඇතුළු ව්‍යාපෘති කළමනාකරණ සේවා
- ගොඩනැගිලි සහ සාමූහික ව්‍යුහයන්හි ව්‍යුහාත්මක සුරක්ෂිතබව පිළිබඳව විමර්ශන පවතින ඉදිකිරීම්වල වාස්තු විද්‍යාත්මක හා අදාළ විශේෂිත වැඩි දියුණු කිරීම් වලදී අදාල උපදේශන සේවා, විශ්ලේෂණ හා සංගණන වාර්තා සැපයීම
- නඩත්තු සේවා සිදුකරගෙන යාම

## 5.2 2011 වසර තුළදී ලබාගත් පැවරුම්

### 5.2.1 ගොඩනැගිලි ව්‍යාපෘති

- අධිකරණ අමාත්‍යාංශයෙහි උපරිමාධිකරණ සංකීර්ණයෙහි නැවත සකස් කිරීම හා අළුත්වැඩියා කිරීමේදී උපදේශක සේවා සැපයීම
- මුල්ලේරියාවෙහි යෝජිත ටී.බී. ඉලංගරත්න ක්‍රීඩාංගනය සඳහා ව්‍යුහාත්මක සටහන් සකස් කිරීම
- කැළණිය ප්‍රාදේශීය සභාව සඳහා හුනුපිටියෙහි සෑදීමට යෝජිත වෙළඳ සංකීර්ණයෙහි ඉදිකිරීම් සඳහා උපදේශන සේවා සැපයීම
- කැළණිය ප්‍රාදේශීය සභාවෙහි හුණුපිටියේ ඉදිකිරීමට යෝජිත මොන්ටිසෝරි ගොඩනැගිල්ල සඳහා උපදේශන සේවා සැපයීම
- කැළණිය ප්‍රාදේශීය සභාවෙහි කැළණිය බස් නැවතුම්පළ හා වෙළඳ සංකීර්ණයෙහි දෙවන අදියරෙහි ඉදිකිරීම් සඳහා උපදේශන සේවා සැපයීම
- බරණැසකන්ද පිලපිටිය යන ස්ථානයෙහි ඉදිකිරීමට යෝජිත ප්‍රජා ශාලාව සහ පුස්තකාලය සඳහා උපදේශන සේවා සැපයීම
- කසළ කළමනාකරණ අධිකාරිය මගින් යෝජිත කරදියාන කොම්පෝස්ට් පොහොර අංගනය සඳහා ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීමට
- කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලයේ තට්ටු දෙකේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම

### 5.2.2 ඉඩම් ගොඩකිරීමේ ව්‍යාපෘති

- නාගරික සංවර්ධන අධිකාරිය මගින් නුවරඑළියෙහි ඉදිවන ඉහළ උන්නතාංශ ක්‍රීඩාංගනය පූර්ණකාලීන ඉදිකිරීම් අධීක්ෂණය කරන අතර එහි ගෙවීම් සඳහා ප්‍රගති සමාලෝචනයද සිදු කරන ලදී. (තාවකාලිකව අත්හිටුවා තිබේ).
- කිරුලපනෙහි කොළඹගේ මාවත හරහා ඉදිකෙරෙන ජලාපවාහන පද්ධතියෙහි ඉදිකිරීම් හා ගොඩකිරීම් සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවා නාගරික සංවර්ධන අධිකාරිය වෙත සැපයීම

### 5.2.3 අනිකුත් වාර්තා

තත්ත්ව ඇගයීම් වාර්තා 51
ටෙන්ඩර් පත් ඇගයීම් වාර්තා 10

## 6. මානව ජනාවාස අංශය

මානව ජනාවාස අංශය පසුගිය වර්ෂය තුළ ආපදා අවමකරණ ව්‍යාපෘතිවලට අදාළ මානව ජනාවාස අධ්‍යයන, ආපදාවලට ඔරොත්තු දෙන නිවාස සඳහා සැලසුම් සකස් කිරීම, ඉදිකිරීම් ආපදා තක්සේරු ව්‍යාපෘති ඇගයිම සහ ආපදා පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු කිරීමේ වැඩමුළු ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ඉඩම් පරිහරණ සිතියම් සහ භූ රූපන සිතියම් නායයෑම් ආපදා කලාපීය සිතියම් පිළියෙල කිරීම සඳහා සපයනු ලැබේ.

### 6.1 උපදේශන ව්‍යාපෘති

**අ. පේරාදෙණිය නගරයෙහි නායයෑම් අවමකරණය සඳහා ඉදිකිරීම් මාර්ගෝපදේශ සැපයීම**

ව්‍යාපෘති යෝජක - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය/ නායයෑම් අධ්‍යයන හා සේවා අංශය, ජා.ගො.ප. සංවිධානය

**ආ. පදියපැලැල්ල නගරයෙහි නායයෑම් ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියෙහි මානව ජනාවාස අධ්‍යයනය**

ව්‍යාපෘති යෝජක - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය/ නායයෑම් අධ්‍යයන හා සේවා අංශය, ජා.ගො.ප. සංවිධානය

**ඇ. නායයෑම් ආපදා ප්‍රදේශවල ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම. මේ සඳහා මානව ජනාවාස ආපදා අවමකරණය පිළිබඳ අධ්‍යයනය කිරීම සහ දැනුවත් කිරීම**

ව්‍යාපෘති යෝජක - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය/ නායයෑම් අධ්‍යයන හා සේවා අංශය, ජා.ගො.ප. සංවිධානය

**ඈ. මහවැලි පෝෂිත ප්‍රදේශයේ දේශගුණික විපර්යාස පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා පූර්ව අධ්‍යයන කටයුතු කිරීම - "දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන නිර්මිත පරිසරයක් ගොඩ නැගීම සම්මන්ත්‍රණය" - 2011 මැයි 12**

ව්‍යාපෘති යෝජක - වැන්ඩර්බිල්ට් පරිසර සහ බලශක්ති ආයතනය, වැන්ඩර්බිල්ට් විශ්ව විද්‍යාලය, ඇමෙරිකා එක්සත් ජනපදය

**ඉ. අපද්‍රව්‍ය භාවිතාකර කඩුවෙල ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත බලශක්ති බලාගාරය නිසා ඇතිවන පාරිසරික බලපෑම් පිළිබඳඅධ්‍යයනය කිරීම**

ව්‍යාපෘති යෝජක - රෙනිව් ජෙන් එන්විරෝ වෙන්චර්ස් පුද්ගලික සමාගම, බැංගලෝර්, ඉන්දියාව

ඊ. පොළොන්නරුව නගරයෙහි ඉදිකිරීමට යෝජිත නාගරික උද්‍යානය සඳහා මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් ලබා දීම

ව්‍යාපෘති යෝජක - තමන්කඩුව ප්‍රාදේශීය සභාව

උ. පසුගිය සුනාමිය තුළින් ලැබූ අත්දැකීම් අනුව ඉදිරියේදී සිදුවිය හැකි විපත් සඳහා මුහුණ දීමට ආසියානු ආපදා පෙර සූදානම්වීමේ මධ්‍යස්ථානය මගින් සකස් කරන මාර්ගෝපදේශන සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම

ව්‍යාපෘති යෝජක - ආසියානු ආපදා පෙර සූදානම්වීමේ මධ්‍යස්ථානය

## 6.2 පුහුණුවීම් සහ වැඩමුළු සංවිධානය කිරීම

**අ. ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් සහ තීරණ ගන්නා කළමනාකාරිත්වයට මානව ජනාවාසවල අවදානම් තක්සේරුකරණය පිළිබඳ පුහුණු කිරීමේ වැඩමුළුව**

ව්‍යාපෘති යෝජක - ජාතික ජල කළමනාකාරිත්ව ආයතනය

**ආ. නායයෑම් ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීමේදී අනුමැතිය ලබා ගැනීමේ කාර්යාවලිය, මානව ජනාවාස අවදානම් කළමනාකරණය සහ සන්නිවේදන උපාය මාර්ග - මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන**

ව්‍යාපෘති යෝජක - ජාතික ජල කළමනාකාරිත්ව ආයතනය

ඇ. භූ තාක්ෂණික සැලසුම් පිළිබඳ දැනුම නවීකරණය පිළිබඳ පාඨමාලාව

ව්‍යාපෘති යෝජක - ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය

**ඈ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආපදාවට ලක්වූ ප්‍රදේශවල පවුල්වල සාමාජිකයන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීමේ වැඩමුළුව**

ව්‍යාපෘති යෝජක - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

**ඉ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආපදාවන්ට ලක්වූ ප්‍රදේශයන්හි පදිංචි වඩු/ පෙදරේරු වෘත්තියේ නියැලීමට අපේක්ෂිත ආධුනිකයන් වෙත වෘත්තීය පුහුණුවට අදාළ න්‍යායාත්මක දැනුම ලබාදීමේ වැඩමුළුව**

ව්‍යාපෘති යෝජක - හොල්සිම් ලංකා ලිමිටඩ්

**6.3 පර්යේෂණ**

**නායයෑම් ආපදා කලාපීය සිතියම් ව්‍යාපෘතිය**

<u>දැනට නිම කර ඇති වැඩ</u>

ගාල්ල දිස්ත්‍රික්කය සඳහා සම්පූර්ණ කර ඇති ඉඩම් පරිහරණ සිතියම්
80/25, 80/24, 86/04, 86/05, 86/09, 86/15

ගාල්ල දිස්ත්‍රික්කය සඳහා සම්පූර්ණ කර ඇති භූ රූපණ සිතියම්
80/25, 86/04, 90/19, 80/15, 80/20, 80/24, 86/15, 86/05, 86/09

කළුතර දිස්ත්‍රික්කය සඳහා සම්පූර්ණ කර ඇති ඉඩම් පරිහරණ සිතියම්
74/07, 74/12

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல / My No. ඩීආර්/ඒ/එන්බීආර්ඕ/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2012 සැප්තැම්බර් 26 දින

අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව සංවිධානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත 2012 ජූනි 30 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණන විෂය පථය

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887220

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887221

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංවිධානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංවිධානයේ සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.24,548,218 ක් වූ මුළු ණයගැතියන්ගෙන් එකතුව රු.3,578,389 ක් වූ ණයගැතියන් 38 දෙනෙකුගෙන් ශේෂ සනාථ කිරීමේ ලිපි ලැබී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මුළු එකතුව රු.24,548,218 ක් වූ ණයගැති ශේෂ වලින් රු.7,397,411 ක් වර්ෂ 5 සිට වර්ෂ 15 දක්වා වූ කාල පරාසයක් තුල අයවීමට ඇති ශේෂ විය. එම මුදල් අයකර ගැනීම සඳහා හෝ එම ශේෂ ඉවත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදීද කිසිදු පියවරක් ගෙන නොතිබුණි,

(ඇ) ඉහත ණයගැති වටිනාකම තුල පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු වර්ෂ 15 ක් පැරණි රු.851,064 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා නීතිපතිවරයාට යොමුකර තිබුණු අතර, 2010 අප්‍රේල් 06 දින නීතිපතිවරයා එම මුදල් අයකර ගැනීමට සංවිධානයට තීරණයක් ලබාදී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය දක්වාම මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ මුළු ණයහිමියන් රු.2,084,027 තුළ වර්ෂ 7 කට වැඩි ණය හිමි ශේෂය රු.1,859,489 ක් වූ අතර වර්ෂ 23 ඉක්මවූ ශේෂය රු.116,566 කි. මේවා සඳහා ප්‍රමාණවත් සාක්ෂි හෝ ශේෂ තහවුරු නොලැබුණු අතර මෙම ශේෂ නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අත්තිකාරම් ලෙස ලබාදුන් සියළුම මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවද ප්‍රවර්තන වර්ෂය අවසානයට එසේ නිරවුල් නොකළ අත්තිකාරම් මුදල් වල එකතුව රු.224,890 ක් විය.

**2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) මුදල් රෙගුලාසි** | |
| (i) මු.රෙ.371 (2) (ආ) | (i) විවිධ කාර්යයන් සඳහා ආයතනයේ නිලධාරීන්ට ගෙවනු ලබන අත්තිකාරම් එක් අවස්ථාවකදී රු.20,000 කට වැඩි නොවිය යුතු වුවද සංවිධානය ඊට අනුකූල නොවී අවස්ථා 21කදී එම සීමාව ඉක්මවා අත්තිකාරම් වශයෙන් රු.772,008 ක මුදලක් ලබාදී තිබුණි. |

(ii) එක් නිලධාරියකු තමා එක් කාර්යයක් සඳහා ලබාගත් අත්තිකාරම නියි පරිදි පියවා ඊළඟ කාර්ය සඳහා අත්තිකාරම් ලබාගත යුතු වුවද එසේ පියවීම් නොකර විවිධ කාර්යයන් සඳහා එකම දිනයකදී හෝ ආසන්න දිනයකදී අත්තිකාරම් කිහිපයක් නිලධාරීන් 09 දෙනෙකු කාර්යයන් 43ක් වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් එකතුව රු.802,850 ක් වු අතර මෙම අත්තිකාරම් මුදල් රෙගුලාසියේ උපදෙස් ප්‍රකාරව 2011 දෙසැම්බර් 31 වන විටත් පියවීම් කර නොතිබුණි.

(ii) මු.රෙ. 371 (2) (ඇ)

ලබාගන්නා ලද අත්තිකාරම් මුදල් කාර්ය නිමකල විගසම සංවිධානය වෙත පියවිය යුතු වුවත් සංවිධානය විසින් පවත්වා ගෙන ගිය ලිපිලේඛන වලට අනුව එකතුව රු.343,500 ක් වු අවස්ථා 19 කදී ගෙවා ඇති අත්තිකාරම් මුදල් මාස 01 සිට මාස 06 දක්වා වු කාල පරාසයක් තුළ ප්‍රමාද කර පියවා තිබුණි.

(iii) මු.රෙ. 757 (1) (ආ) සහ 757(2)

සංවිධානය විසින් සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේ දී අතිරික්තයන් හා ඌනතාවයන් 37 ක් පමණ පැවති අතර එය සමීක්ෂණ මණ්ඩල වාර්තාවල සටහන් කර නොතිබුණි.

(ආ) 1990 ඔක්තෝබර් 10 දින හා අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

සංවිධානය සතුව පවතින වාහන 12 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය පිළිබඳව චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) ආයතනයේ චක්‍රලේඛ

-----------------------

2011 අප්‍රේල් 07 දිනැති අංක එන්බීආර්ඕ/ සීඅයිආර්/2011/03 දරන චක්‍රලේඛය

සංවිධානය විසින් ධාවනයේ යොදවා ගත් කුලී වාහන 10 ක් වෙනුවෙන්, අවස්ථා 43 කදී එකතුව රු.581,826 ක් එම සීමාව ඉක්මවා සැපයුම්කරුවන්ට ගෙවීම් කර තිබුණද ඒ සඳහා කිසිම අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

## 2.4 අධිකාර් බලයෙන් තොර වූ ගනුදෙණු

නායයෑම් සිතියම්ගත කිරීම වෙනුවෙන් සහ ප්‍රාග්ධන වත්කම් මිළදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 17.5 ක් සහ රු.මිලියන 15ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙතින් ප්‍රවර්තන වර්ෂය තුලදී ලබාගෙන තිබුණද, එම කාර්යයන් සඳහා රු.මිලියන 21.5 ක් බැගින් රු.මිලියන 43 ක් වැයකර තිබුණි. ලබාගත් ප්‍රතිපාදන ඉක්මවා වැය කර ඇති රු.මිලියන 10.5 ක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සංවිධානයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 15,406,703 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,110,104 ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,296,599 ක වර්ධනයක් පෙන්නුම් කෙරේණි. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ සමාලෝචිත වර්ෂයේ ආදායම 43% කින් වැඩිවී තිබීමයි.

### 3.2 විශ්‍රහාත්මක සමාලෝචනය

සංවිධානය විසින් ඉටුකරනු ලබන කාර්යයන් වලින් ඉලක්කගත ආදායම රු.මිලියන 170.5 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 169.7 නොහොත් 99.5% ක් සාක්ෂාත් කර ගෙන තිබුණි. තවද මානව ජනාවාස අංශයේ ආදායම සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය 44% ක් වූ අතර ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය, භූ තාක්ෂණ ඉංජිනේරු අංශය, නායයෑම් අධ්‍යයන හා සේවා අංශය, පාරිසරික අංශය සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය යන අංශවල ඉලක්කගත ආදායමින් 70% ට වඩා වැඩි ඉපයීමක් ලගාකර ගෙන තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ආපදා වැලැක්වීම පෙරදැරිව ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට හා ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි ස්ථිර සාර සංවර්ධනයට අවශ්‍ය වන්නා වූ පර්යේෂණ හා තාක්ෂණික සේවා සැපයීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ප්‍රධාන කර්තව්‍යයක් වන අතර වර්තමානයේ නායයෑම් අවම උපදව කලාප සිතියම් ගත කිරීම හා නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘති පවත්වා ගෙනයාම සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම මූලික වී තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රවර්තන වර්ෂය අවසානයට කාර්ය සාධනය පහත දැක්වේ.

(අ) **නායයෑම් උපදව කලාප සිතියම් ගත කිරීම**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙන් ලැබුණු මුදල් ආධාර උපයෝගී කර ගනිමින් නායයෑම් උපදව කලාප සිතියම් ගත කිරීම ආරම්භ කර තිබුණු අතර 1990 වර්ෂයේ සිට 2011 වර්ෂය වන තෙක් භාණ්ඩාගාරයෙන් ප්‍රදාන ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 327.30 ක් භාණ්ඩාගාර ප්‍රදාන ලැබී තිබුණු අතර ඒ සඳහා දරන ලද මුළු වියදම රු.මිලියන 303.33 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සිතියම්ගත කිරීමේ කාර්යයට කළුතර දිස්ත්‍රික්කයේ සිතියම් 16 ක් නිමකිරීමට සැලසුම් කර තිබුණු අතර වර්ෂය අවසානයට එම සිතියම් 16 ම සකස්කර අවසන් කර තිබුණි.

(ආ) **නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති**

මහනුවර, බදුල්ල, නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්ක වල නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතියක් 2009 වර්ෂයේ සිට ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන අතර එම ව්‍යාපෘතිය 2011 වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුව රු.මිලියන 150 ක් වු අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් පරිදි අරමුදල් යොදවා තිබුණි.

| වර්ෂය | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් අරමුදල් ලැබීම් | වියදම් දැරීම් |
|---|---|---|
| | (රු. මිලියන) | (රු. මිලියන) |
| 2009 | 34.8 | 34.80 |
| 2010 | 51.0 | 35.00 |
| 2011 | - | 43.62 |

සංවිධානයේ නායයෑම් අධ්‍යයන හා සේවා අංශය විසින් මෙම කාර්යභාරය සිදුකර ගෙන යනු ලබන අතර ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබෙන මුදල අදාල අංශයේ ආදායම ලෙස ගිණුම් ගත කර ලැබුණු සම්පූර්ණ මුදලම ආයතනයේ වියදම් යටතේම ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය වන විටත් අවසන්ව් නොමැති බැවින් මෙම වර්ෂය තුලදී දරන ලද රු.මිලියන 43.62 ක් වු සම්පූර්ණ වියදම් කෙරීගෙන යන වැඩ යටතේ ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) **නායයෑම් පිළිබඳ විශේෂ අධ්‍යයනයන් පිළිබඳ වාර්තා නිකුත් කිරීම**

ආපදා අවදානම් සහිත ප්‍රදේශවල දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් ගේ ඉල්ලීම මත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් විශේෂ අධ්‍යයනයන් හා වාර්තා ලබාදීම සිදුකර තිබුණි. මහා භාණ්ඩාගාරය විසින් වසරකට රු.මිලියන 10 ක

ප්‍රතිපාදනයක් ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීමට 2011 වර්ෂයේදී ඇස්තමේන්තු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. සමාලෝචිත වර්ෂය තුලදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් කරන ලද ඉල්ලීම් මත නායයෑම් පරීක්ෂණ 190 ක් වෙනුවෙන් රු.3,221,885 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඒ සඳහා රු.2,085,939 ක් වර්ෂය තුලදී ලැබී තිබුණු අතර රු.1,135,946 ක් ලැබිය යුතුව තිබුණි.

ii. විශේෂ අධ්‍යයනයන් හා වාර්තා ලබාදීම වෙනුවෙන් රු.3,411,229 ක මුදලක් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන අනුව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණ ද එම වටිනාකම සම්බන්ධව වූ පරීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවිණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංවිධානය විසින් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයට ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු. මිලියන 21.5 ක් භාණ්ඩාගාරය වෙතින් ලබා ගැනීමට යෝජිත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයට රු.මිලියන 19 ක ප්‍රාග්ධන මිලදී ගැනීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද සංවිධානය විසින් එම ප්‍රසම්පාදන සැලැස්මේ අවශ්‍යතාවයට වඩා වැඩි වටිනාකමක් හෙවත් රු. මිලියන 23.65 ක ප්‍රාග්ධන වත්කම් මිලදී ගෙන තිබුණු අතර භාණ්ඩාගාරයෙන් රු. මිලියන 17 ක් ඒ සඳහා ලැබී තිබුණි. මිළදී ගැනීමේ සීමාව ඉක්මවීම් සඳහා අදාළ අනුමැතින් ලබාගත් බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිය.

(ආ) නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ , පදියපැලැල්ල හා පේරාදෙණිය යන ප්‍රධාන ව්‍යාපෘති දෙකෙහි විවිධ වියදම් සඳහා සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව විසින් රු.මිලියන 35 ක් වියදම් අයිතම 40 ක් සඳහා අනුමත කර තිබුණු නමුත් ව්‍යාපෘතියේ වැදගත් වන අයිතම් 14 ක් සඳහා රු.මිලියන 30.16 ක් ඇස්තමේන්තු කර රු.මිලියන 34.42 ක් සමාලෝචිත වර්ෂයේදී වියදම් කර තිබුණි. ඒ අනුව රු.මිලියන 4 ක් ඇස්තමේන්තුවට වඩා වැඩියෙන් වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව නිරීක්ෂණය වන්නේ කළමනාකාරීත්වයේ පාලනය හා මග පෙන්වීම් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වී නොමැති බවය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසය තුල පවත්වන ලද අන්තර්කාලීන කමිටු රැස්වීමේ දී සංවිධානයේ ප්‍රධාන ගොඩනැගිලි පරිශ්‍රය වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 4.87 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණු නමුත් එය වර්ෂය තුලදී ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

4.3 සංවිධානයේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2011 දෙසැම්බර් 31 දිනට සංවිධානයේ අනුමත කාර්ය මණ්ඩලය 274 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 157 හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 67 ක් විය.

සංවිධානය විසින් අනුමත සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ පරිපාටිය හා සංවිධාන සටහන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සමාලෝචිත වර්ෂය තුළ දී ලබාගෙන තිබුණු අතර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය 2012 වර්ෂය තුළදී ලබාදීම හේතුවෙන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම ප්‍රමාද වී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සංවිධානයේ අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ඉක්මවා මිලදී ගැනීම් සිදුවී තිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත වියදම් සීමාවන් ඉක්මවා වැය ශීර්ෂ 10 ක එකතුව රු.19,043,735 ක තථ්‍ය වියදම් දරා තිබුණි. මෙම වියදම් ප්‍රතිපාදිත සීමාව ඉක්මවා 1.5% ත් 99% ත් අතර පරාසයක් තුල පැවතුණි. එහෙත් සීමාවන් ඉක්මවා වියදම් දැරීම සඳහා විධිමත් අනුමැතින් ලබාගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ණයගැතියෝ
(ආ) අයවැය ලේඛනය
(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම
(ඈ) අත්තිකාරම් ලබාදීම හා නිරවුල් කිරීම

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
அனர்த்த முகாமைத்துவ அமைச்சு
Ministry of Disaster Management

දුරකතන / தொலைபேசி / Telephone: 011-2588946, 011-2503431, 011-2500354
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 011-2505149
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2502611
වෙබ්අඩවිය / இணையத்தளம் / Website: www.nbro.gov.lk
ඊමේල් / மின்னஞ்சல் / E-mail: nbro@sltnet.lk

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனம்
NATIONAL BUILDING RESEARCH ORGANISATION

99/1, ජාවත්ත පාර, කොළඹ 5.
99/1, ஜாவத்தை வீதி, கொழும்பு 5.
99/1, Jawatta Road, Colombo 5.

Our Ref} NBRO/DG/AUDIT/2011 Your Ref} ඩීපී/පී/එන්බීආර්ඕ/එෆ්ඒ/2011 Date} 2012.10.17

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**<u>ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

ඔබගේ අංක එන්ඩී/බී/එන්බීආර්ඕ/එෆ්ඒ/2011 හා 2012 සැප්තැම්බර් 26 දරණ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් අදහස් පහත දක්වා ඇත.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ශේෂ පත්‍ර දිනට පැවති ණයගැතියන්ගෙන් 38 දෙනෙකු වෙත ණයගැති ශේෂ සනාථ කිරීමේ ලිපියවා තිබූ අතර එම ණයගැතියන් ශේෂය තහවුරු කර ලිපි එවා නොතිබුණි. ඒ අනුව ණයගැති ශේෂයන් බොහොමයක් සනාථ කර ගැනීමට හැකි වී ඇත.

(ආ) ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා සියළු උත්සහයන් දැරීමෙන් පසුව සහ වර්ෂ 5 සිට 15 දක්වා වූ ණයශේෂ අයකර ගැනීම සඳහා සිහි කැඳවීමේ ලිපි යැවීමෙන් අනතුරුවද ඉතිරිවී ඇති ණයශේෂයන් කපා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමියගේ අවසර මත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

(ඇ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.854,064 ක් වූ මුදල ගෙවීම් කර සමථයකට පත්කර ගන්නා ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ 2010 අප්‍රේල් 06 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාගේ 2010.05.31 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බවයි. මෙම කරුණු සැලකිල්ලට ගෙන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු මගින් අවශ්‍ය ප්‍රතිපාදන අප ආයතනයට ලබාදෙන ලෙස අමාත්‍යංශ ලේකම්තුමිය මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

(ඈ) ප්‍රවර්තන වර්ෂයේ ගෙවිය යුතු මුළු ණයහිමියන්ගේ ශේෂයෙන් රු1,857,489 ක් වූ මුදල වර්ෂ 07 කට වඩා පැරණි ණයහිමි ශේෂ වන අතර එම ණයහිමි ශේෂ ඊට පෙර විගණනය කල ගිණුම් වල සඳහන් ගෙවිය යුතු ණයහිමි ශේෂයන් වන අතර, එම ණයහිමි ශේෂ වලට අදාල ලිපිගොනු මේ වනවිට සොයාගැනීමට නොහැකි වී ඇත.

රු 116,566 ක මුදල 1987 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ණයහිමි ශේෂයක් වන අතර, මෙයට අදාල ලිපිගොනු නොමැත. රු.1,740,923 ක් වූ ණයහිමි ගෙවීම් වලින් රු.740,923 ක මුදල ණයගැතියන් ඔවුන්ගේ ඉන්වොයිස් අගයන් සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල් වේ. එම වැඩිපුර ගෙවූ මුදල් ණයහිමි ශේෂයන් සේ පොත්වල සටහන් වුවද සත්‍ය වශයෙන් ණයහිමි ශේෂ නොවන අතර අන්තර් කළමනාකරණ කමිටුව වෙත තත්වය පැහැදිලි කර විසඳුමක් ලබාගැනීමට යෝජිතය.

(ඉ) මුදල් අංශය මගින් දෙසැම්බර් 31 දිනට පෙර ලබාගත් සියළු මුදල් අත්තිකාරම් නිරවුල් කරන ලෙස නිලධාරින්ට දන්වා යවා ඇති අතර, එමගින් සැලකිය යුතු මුදල් අත්තිකාරම් ප්‍රමාණයක් නිරවුල් වූ අතර විශේෂ තත්ත්වයන් මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සඳහා ලබාගත් මුදල් අත්තිකාරම් නිරවුල් කිරීම නියමිත දිනට පෙර සිදු නොවුනි. වර්තමානයේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

**2.3 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.**

(අ) මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 371 (2) (ආ)

(i) මුදල් රෙගුලාසි 371 (2) (ආ)යටතේ නිකුත් කරනු ලබන රු.20,000 උපරිම මුදල් අත්තිකාරම් සීමාව අප ආයතනය විසින් සිදුකරනු ලබන ක්ෂෙත්‍ර කටයුතු හා පරීක්ෂණ කටයුතු සඳහා උපයෝගී කර ගැනීම ඉතා දුෂ්කරය. උදාහරණයක් ලෙස නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඇති ක්ෂෙත්‍ර කටයුතු වලදී රු.මිලියන 1 ත් 2ත් අතර වූ මුදල් ප්‍රවාහයක් සංසරණය වේ. එහිදී රු.20,000 මුදල් අත්තිකාරම් සීමාව තුල කටයුතු කලහොත් ව්‍යාපෘතියේ කටයුතු අඩාල වේ. තවද භූතාක්ෂණ අංශය විසින් යාපනය වැනි දුර බැහැර ප්‍රදේශවල දිගුකාලීනව සිදුකරනු ලබන ක්ෂෙත්‍ර කටයුතු වලදී මෙන්ම මානව ජනාවාස අංශය විසින් සිදුකරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහාද මෙම රු.20,000 සීමාව තුල කටයුතු කිරීම කාර්යක්ෂම නොවන අතර වානිජමය වශයෙන්ද අහිතකර ලෙස බලපානු ලබයි. එම නිසා කාර්යන්ගේ ස්වභාවය අනුව මුදල් රෙගුලාසි වල සඳහන් රු.20,000 සීමාව තුල කටයුතු කිරීම අපහසු හෙයින් මුදල් අත්තිකාරම් සීමාව වැඩිකර ගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් සිටී.

භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තෙක් මුදල් රෙගුලාසි තුල ඉතා අපහසුවෙන් වුවද කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ii) මෙම අත්තිකාරම් වලින් බොහොමයක් ක්ෂෙත්‍ර කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම් වේ. මෙහි සඳහන් ආකාරයට එක් නිලධාරියෙකුට කම්කරුවන් පිරිසක් සමග මාසයක් හෝ ඊට අධික කාලයකට ක්ෂෙත්‍ර කටයුතු වල නිරත වීමට සිදුවේ. මෙහිදී මෙම නිලධාරියාට ක්ෂෙත්‍රයේ අවශ්‍යතා මත විවිධ ආකාරයේ වියදම් සඳහා මුදල් ලබාගැනීමට සිදුවේ. උදාහරණ ලෙස ගෙවල් කුළී, කම්කරු කුළී, යන්ත්‍ර සඳහා ඉන්ධන, යන්ත්‍ර අළුත්වැඩියා හා වාහන කුළී වැනි විවිධ වියදම් සඳහා ක්ෂෙත්‍රයේ එකම නිලධාරියා නමට මුදල් නිකුත් කරනු ලබයි. මෙහිදී කෙටිකාලසීමාවක් තුල අත්තිකාරම් ලබාගත් බව පෙනී ගියත්, එම අත්තිකාරම් භාවිතා කර ඇත්තේ ක්ෂෙත්‍ර කටයුතු වලදී විවිධ වියදම් අයිතම් යටතේය. එසේ නැතහොත් එක් අත්තිකාරමක් ලබාගෙන එය පියවා නැවත අත්තිකාරම් ලබාගැනීමට යාමේදී, ආයතනයේ ආදායම් ඉපයීමේ පරමාර්ථ කරා ගමන් කිරීමේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකි වනු ඇත. ක්ෂෙත්‍ර කටයුතු වලදී මෙවැනි කරුණු සම්බන්ධයෙන් වෙනත් සාර්ථක විකල්ප ක්‍රියාමාර්ගද නොමැත.

එසේ වුවද හැකි සෑම අවස්ථාවකදීම ඉතා ඉක්මනින් අත්තිකාරම් පියවීමට ක්‍රියාකරන ලෙස නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. අත්තිකාරම් සීමාව වැඩිකර ගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් පසු මෙම තත්ත්වය මගහැරී යනු ඇත.

(ii) මුදල් රෙගුලාසි 371 (2) (ඇ)

අත්තිකාරම් බොහොමයක් කොළඹින් දුර බැහැර ප්‍රදේශවල දිගුකාලීනව සිදුකරනු ලබන ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් නිලධාරින් විසින් ලබාගත් අත්තිකාරම් වේ. අත්තිකාරම් ලබාගනු ලබන්නේ ක්ෂෙත්‍ර කටයුතු සඳහා දරනු ලබන වියදම් සඳහා වන අතර ව්‍යාපෘතිය අවසානයේ ලබාගත් සියළුම අත්තිකාරම් නිරවුල් කිරීම කරනු ලබයි. ව්‍යාපෘතිය කරගෙන යන අතරවාරයේ අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට පැමිණීම වියදම් අධික මෙන්ම වැඩබිමෙහි සේවය කිරීමට ඇති කාලයද අඩුවේ. තවද එක් එක් ක්ෂෙත්‍ර කටයුත්තක් අවසන් වී ඒ සමගම වෙනත් ක්ෂෙත්‍රයකට නිලධාරින්ට වහාම වාර්තා කිරීමට සිදුවන අවස්ථා වලදී එම අත්තිකාරම් ලබාගත් නිලධාරින්ට ප්‍රධාන කාර්යාලයට පැමිණ අත්තිකාරම් පියවීමට නොහැකි වී ඇත. බොහෝ ව්‍යාපෘති කාලරාමුවක් තුල අවසන් කලයුතු ව්‍යාපෘති වේ. එම ව්‍යාපෘති නියමිත දිනයන් තුලදී අවසන් නොකලහොත් දඩ මුදල් ගෙවීමට සිදුවීම මගින් ආර්ථිකමය අලාභද සිදුවේ. කෙසේ වෙතත් ඉදිරියේදී මෙම තත්වය මගහරවා ගනිමින් කටයුතු කරන ලෙසට නිලධාරින්ට උපදෙස් දීමට ක්‍රියකරනු ලැබේ.

(iii) මුදල් රෙගුලාසි 757 (1) (ආ) සහ 757 (2)

අංශයන් අතර අතිරික්ත හෝ ඌනතාව සඳහන් වුවද සමස්ත වශයෙන් ආයතනයේ අතිරික්තයක් හෝ ඌනතාවයක් දැකිය නොහැකිය. එයට හේතුව වනුයේ අංශ අතර භාණ්ඩ හුවමාරු කිරීම් වාර්තාගත නොවීමයි. මින් ඉදිරියට මෙලෙස තොග අයිතම් අංශ අතර හුවමාරු කිරීම් එම අවස්ථාවේදී අවශ්‍ය ලේඛනද යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී.

(ආ) 1990 ඔක්තෝබර් 10 දින හා අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා අදාල නිලධාරියාට උපදෙස් ලබා දී ඇත. දැනටමත් බොහොමයක් නිලවාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර ඇත.

(ඇ) **ආයතනයේ චක්‍රලේඛ**

2011 අප්‍රේල් 07 දිනැති අංක එන්බීආර්ඕ/සීඅයිආර්/2011/03 දරන චක්‍රලේඛය

මෙම චක්‍රලේඛය දිස්ත්‍රික් කාර්යාල ආරම්භයේදී අභ්‍යන්තර පාලනයක් ඇති කිරීම සඳහා නිකුත් කරන ලද්දකි. නමුත් පසු විමර්ශනයේදී මෙම සීමාව තුල කටයුතු කිරීම ප්‍රායෝගික නොවන බව නිරීක්ෂණය වූ බැවින් මෙම චක්‍රලේඛය සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී.

**2.4 අධිකාරී බලයෙන් තොරවූ ගනුදෙනු**

නායයෑම් සිතියම් ගතකිරීම වෙනුවෙන් සහ ප්‍රාග්ධන වත්කම් මිළදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 21.5 බැගින් වියදම් දරන ලදී. මෙම කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන අනුමත කර ඇති අතර (ඇමුණුම-01 බලන්න) ඒ අනුව අදාල

ඇස්තමේන්තුව තුල වියදම් සිදුකර එම වියදම් වලට අදාලව හිඟහිට් ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත (ඇමුණුම-02 බලන්න). ඒ අනුව මෙම වියදම් සිදුකර ඇත්තේ භාණ්ඩාගාරයේ රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ අනුමත කල ප්‍රතිපාදන තුලය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

සටහන් කර ගන්නා ලදී.

### 3.2 විග්‍රහාත්මක සමාලෝචනය

තරගකාරී තත්වයන් මත උපදේශන ලබාගෙන අවශ්‍ය ඉලක්කකරා පැමිණ ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**(අ) නායයෑම් උපද්‍රව කලාප සිතියම් ගත කිරීම**

මෙහි කාර්ය සාධනය සටහන් කර ගන්නා ලදී.

**(ආ) නායයෑමේ අවම කිරීමේ ව්‍යාපෘති**

නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා දරණ ලද වියදම් ආයතනයේ සාමාන්‍ය වියදම් අයිතම් යටතේම ගිණුම් ගත කර ඇත. මෙම තත්ත්වය 2012 වර්ෂයේ සිට නිවැරදි කර ඇත.

නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති වලට අදාලව 2011 වර්ෂයේදී නිමකල යුතු වැඩ කොටස නිමකලද, ඊට අදාල මුදල් නොලැබීම හේතුවෙන් විශේෂ ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා ඇත. අදාල වැඩ කොටස නිමකර ඇති බැවින් මහා භාණ්ඩාගාරයද මෙය අතිරේක ප්‍රතිපාදන යටතේ නිදහස් කිරීමට එකග විය.

**(ඇ) නායයෑම් පිළිබඳ විශේෂ අධ්‍යයනයන් පිළිබඳ වාර්තා නිකුත් කිරීම**

(i) මෙහි සඳහන් පරීක්ෂණ වාර්තා සඳහා රු.3,221,885 ක මුදලක් ප්‍රතිපූරණය සඳහා ඉල්ලුම් කර ඇති අතර රු.2,085,939 ක් 2011 වර්ෂය තුලදී ලැබුණි. ඉතිරි මුදල වන රු.1,135,946 ක මුදල 2012 වර්ෂය තුලදී ලැබී ඇත.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව විශේෂ අධ්‍යනයන් හා වාර්තා ලබාදීම වෙනුවෙන් රු.3,411,229 ක මුදලක් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එයින් රු.1,135,946 ක් වූ මුදල විශේෂ අධ්‍යයනයන් හා වාර්තා ලබාදීම වෙනුවෙන් විය යුතු අතර ඉතිරි ලැබිය යුතු මුදල වන රු.2,275,283 ක මුදල ගොඩනැගිලි සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම වෙනුවෙන් ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම් කල මුදල වේ.

ඒ අනුව මහා භාණ්ඩාගාරය මගින් අනුමත කල රු. මිලියන 10.00 ට අදාල ව රු.6,588,771.00 ක මුදලක් ලැබී ඇති නිසා ඉතිරි මුදල වන රු.3,411,229.00 ක අගයක් අවසන් ගිණුම්වල ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත. මේ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලැබිය යුතු අරමුදල් ඉල්ලුම්කර ඇත. (ඇමුණුම - 03 බලන්න)

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් මිළදී ගැනිමට රු.මිලියන 21.5 ක් නිදහස් කරන ලෙස භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මට අනුව ටෙන්ඩර් කැඳවා අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීමට ටෙන්ඩර් ප්‍රදානය කරන ලදී. භාණ්ඩාගාරය සැප්තැම්බර් මස සිට ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාද කලද ටෙන්ඩර් ප්‍රදානය සිදුකර ඇති බැවින් ද ගිවිසුම් අනුව මුදල් ගෙවිය යුතු බැවින් ද උපයාගත් මුදල් වලින් ගෙවීම් සිදුකරන ලදී. එම මිළදී ගැනීම් අතර රු.501,281 අත්‍යවශ්‍ය විද්‍යාගාර උපකරණ මිළදී ගැනීමද ඇතුලත්ව ඇත. ඊට අමතරව යතුරු පැදි මිළදී ගැනිම සඳහා රු.1,650,000ක අතිරේක ප්‍රතිපාදන වෙන්කිරීම් ලැබුණි. ඒ සඳහා මහාභාණ්ඩාගාරයේ සම්පූර්ණ අනුමැතිය ඇතිව කටයුතු කර ඇත.

(ආ) නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා මෙහි සඳහන් කර ඇති වියදම් අයිතම් 14 මෙම ව්‍යාපෘතියේ ඉතා වැදගත් වියදම් අයිතම් වේ. එනම් වැටුප්, වේතන, අතිකාල දීමනා, ප්‍රවාහන වියදම්, වෙනත් ද්‍රව්‍ය මිළදී ගැනීම්, උපකොන්ත්‍රාත් ගෙවීම්, කුළී වියදම් යනාදී වියදම් ඇතුලත් වේ. 100% අවදානමක් ඇති මෙවැනි නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති කරගෙන යාමේදී ඇතිවූ තාක්ෂණික ගැටළු මත ඇස්තමේන්තු මුදල් වෙනස් වී ඇති නමුත්, අන්තර්කාලීන කළමනාකරණ කමිටුව අනුමත කරන ලද මුළු ව්‍යාපෘති ඇස්තමේන්තුව තුල මෙම කටයුතු ක්‍රියාත්මක කර ඇත.

ව්‍යාපෘතින්හි අසම්භාව්‍යයන් පැවතියද ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී බොහෝදුරට නිවැරදිව ගණනය කිරීමට පියවර ගනුලැබේ.

(ඇ) මෙම කාර්ය සඳහා අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබුණ ද මහා භාණ්ඩාගාරයේ අනුමැතිය හා මුදල් ලබාගැනීමට නොහැකි වූ බැවින් මේ සඳහා ප්‍රතිපාදන නොමැති විය. උපදේශන සේවා වලින් උපයාගත් මුදල් කාරක ප්‍රාග්ධනය ලෙස තබාගැනීමට සිදුවූ බැවින් මෙම කාර්ය ඉටුකිරීමට නොහැකි වී ඇත.

**4.3 සංවිධානයේ අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය**

බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන සැලැස්මට අනුවම කාල පරාසයන් තුල කටයුතු කර ඇත. ඊට අමතරව අත්‍යවශ්‍ය විද්‍යාගාර හා ක්ෂේත්‍ර උපකරණ නියමිත පරිදි ටෙන්ඩර් කැඳවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අනුමැතියට යටත්ව රු.500,000 කට ආසන්න මුදලකට මිළදීගෙන ඇත.

ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කිරීමට සටහන් කරගන්නා ලදී.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

මෙහි සඳහන් වියදම් ශීර්ෂ 10 යටතේ අයවැයගත වියදම් ඉක්මවා කටයුතු කිරීමට සිදුවූයේ 2011 වර්ෂයේ මාර්තු මස සිට ඉදිකිරීම් සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ කාර්යය සඳහා දිස්ත්‍රික් කාර්යාල 09 ක් ආරම්භ කර කටයුතු කරගෙන යාමට සිදුවීම නිසාය. 2011 වර්ෂයේ අයවැය පිළියෙල කිරීමේදි මෙවැනි ව්‍යාපෘතියක් පිළිබඳව ආයතනය වෙත දන්වා නොතිබුණි. එහිදී ඇස්තමේන්තු නොකල වියදම් වශයෙන් දැරීමට සිදුවූ කාර්යාල කුළී ගෙවීම, වාහන කුළී ගෙවීම, නව සේවක වැටුප් හා වේතන, අතිකාල, ගමන් වියදම්, ප්‍රවාහන වියදම්, කුළී, මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදම්, වෙනත් ද්‍රව්‍ය මිළදී ගැනීම් ආදි වියදම් ඇස්තමේන්තු තුල වියදම් සීමාව යටතේ පවත්වාගෙන යාමට නොහැකි වී ඇත.

මීට අමතරව නායයෑම් ව්‍යාපාති සඳහාද ඇතැම් කාර්යන් ඇස්තමේන්තු කල කාර්යය ප්‍රමාණයට වඩා වැඩිපුර කිරීමට සිදුවීම නිසා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීමට සිදුවීම හේතුකොට ගෙන වෙනත් ද්‍රව්‍ය වියදම් වල අගය ඇස්තමේන්තු කල අගයට වඩා වැඩි වී ඇත.

නමුත් මෙම සියළුම වියදම් අනුමත සමස්ථ අයවැය තුල සිදුකරනු ලැබූ අතර සෑම අයවැය මාරු කිරීමකදීම අදාල බැඳීම් පත්‍රයේ සටහන් කර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන ඇත. එම බැඳීම් පත්‍ර අදාල ගෙවීම් වවුචර වලට අමුණා ඇත.

## 6. පද්ධති හා පාලනය

මෙහි සඳහන් පද්ධති හා පාලන අඩුපාඩු නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලදී

…………………………

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය**

පිටපත :- (I) ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය
(II) ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යංශය

NATIONAL BUILDING RESEARCH ORGANISATION
99/1, Jawatte Road, Colombo 5.
Tele: 011-2588946, Fax: 011-2502611
email : nbro@sltnet.lk,  web : www.nbro.gov.lk